
# දූෂණයෙන් - භීෂණයෙන් තොර
# මිනිස්කම රජයන
# සැමට සැමද සුරක්ෂිත
# සමෘද්ධිමත් සමාජයක් සඳහා



## පොදුජන එක්සත් පෙරමුණු රජයේ

# ප්‍රතිපත්ති ප්‍රකාශනය

6646

6646
808.51

# පොදුජන එක්සත් පෙරමුණ රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය

## 1994

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ

විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමටත්, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කර ක්‍රියාත්මක කිරීමටත් පොදුජන එක්සත් පෙරමුණ ශ්‍රී ලංකාවාසී ජනතාවගෙන් ජනවරමක් පතයි. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ජනතාවගේ පරමාධිපත්‍යය සපුරා ප්‍රතිෂ්ඨාපනය කරනු ලබන අතර, ජනතාව පාර්ලිමේන්තු නියෝජිතයින් මගින් තම පරමාධිපත්‍යය ක්‍රියාත්මක කරනු 'ඇත. පොදුජන එක්සත් පෙරමුණ ආණ්ඩුවක් පිහිටුවීමෙන් අනතුරුව නව ව්‍යවස්ථාවක් කෙටුම්පත් කර සම්මත කර ගැනීමේ කාර්යය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලයක් කැඳවනු ඇත. නව ව්‍යවස්ථාවේ බලය සහ අධිකාරය පැන නැගෙනු ඇත්තේ මැතිවරණයේ දී ප්‍රකාශයට පත්වන ජනතාවගේ දේශපාලන කැමැත්ත වෙතිනි.

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ, පහත සඳහන් පරිදි වනු ඇත.

I. ජනතාවගේ පරමාධිපත්‍යය, සමස්ත ආණ්ඩුක්‍රම පද්ධතියේ ම මුල්ගල වනු ඇත.පාර්ලිමේන්තුවේ සංයුතිය තීරණය කරන, නියි කලට පවත්වනු ලබන පාර්ලිමේන්තු මැතිවරණ, නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ ජීව රුධිරයයි. මේ මූලධර්මයේ අති මහත් වැදගත්කම පිළිගන්නා පොදුජන එක්සත් පෙරමුණ, පාර්ලිමේන්තුවේ නිල කාලය දීර්ඝ කිරීමේ අරමුණින් දැනට පවත්නා තුනෙන් දෙකක වැඩි ඡන්දයේ උපක්‍රමය සහ ජනමත විචාරණය යන විධිවිධාන වහා ම අවලංගු කරනු ඇත.

II. 1978 පටන් අප රටට ශාපයක් වී ඇති විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම හදිසි ප්‍රමුඛතා කාර්යක් හැටියට සිදු කරන අතර, කැබිනට් සහ පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය යළි පිහිටුවීම මගින් ජනතාවගේ දේශපාලන අභිලාෂයේ ශ්‍රේෂ්ඨභාවය ප්‍රතිෂ්ඨාපනය කරනු ඇත. අපේ රටේ මෑතකාලීන අත්දැකීම් වලින් අබමල් රේණුවක හෝ සැකයකින් තොරව පැහැදිලි වන දෙය නම්, කිසිදු ඵලදායී සංවරණ හා තුලන ක්‍රමයකින් තොරව, පෙර නොවූ විරූ බලතල සම්භාරයක් විධායක ජනාධිපතිවරයාගේ අතෙහි කේන්ද්‍රගත වීම නිසා පුද්ගලිකවත් සාමූහිකවත් අප ජනතාව සතු මූලික ලක්ෂණයන් වන නිදහස, නිර්මාණශීලිත්වය සහ පුරෝගාමිත්වයට විනාශකාරී ලෙස බලපා ඇති බවයි. අප ජනතාවගේ දේශපාලන ජීවිතය අතීතයේ දී පොහොසත් කළ උසාවි පද්ධතිය, පාර්ලිමේන්තුව සහ ජනමාධ්‍යය යනාදී සියලු ආයතන බාල්දු කිරීමටත්, දුර්වල කිරීමටත් විධායක ජනාධිපති ක්‍රමය තුඩු දී ඇත. පාර්ලිමේන්තුවේ සාමාජිකත්වය දරණ සහ පාර්ලිමේන්තුවට වග කියන අගමැතිවරයෙකුගේ මූලිකත්වයෙන් යුත් කැබිනට් ආණ්ඩු ක්‍රමය යළි පිහිටුවීම මගින් ජනතාව වෙතට යළි බලය පැවරීමට පොදු ජන එක්සත් පෙරමුණ ස්ථිරසාර ලෙස ම කැප වී සිටියි. නව ආණ්ඩුක්‍රමය තුළ නාමික රාජ්‍ය නායකයා ක්‍රියා කරනු ඇත්තේ, කැබිනට් මණ්ඩලය විසින් දෙනු ලබන උපදෙස් අනුව ය.

III. සමානුපාතික නියෝජන ක්‍රමය සංශෝධනයන්ට යටත්ව දිගටම පවතිනු ඇත. එහි ප්‍රධාන සංශෝධනය වනු ඇත්තේ, ජර්මනියේ පවතින ක්‍රමයට සමානව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් අර්ධයක් ඡන්ද කොට්ඨාශ ක්‍රමයට අනුවත් අනෙක් අර්ධය සමානුපාතික නියෝජන මූලධර්මය අනුවත් තෝරා ගැනීම යි. මේ මිශ්‍ර ක්‍රමය මගින් සමානුපාතික නියෝජන ක්‍රමයේ යහපත් අංග තවදුරටත් තබා ගනිමින්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ ඡන්දදායකයින් අතර කිට්ටු සබඳතා පවත්වා ගැනීමට අවකාශ සැලසෙනු ඇත. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු, තමන් තේරී පත් වූ දේශපාලන පක්ෂයෙන් ඉල්ලා අස්වීම හෝ නෙරපීම නිසා පක්ෂ සාමාජිකත්වය ඔහුට හෝ ඇයට අහෝසි වූ විට, එම මන්ත්‍රී ආසන හිස් වන අතර, ඒ අඩුව සඳහා අතුරු මැතිවරණ පවත්වනු ඇත. පක්ෂ සාමාජිකත්වය අහිමි වූ මන්ත්‍රීවරයාට, එම අතුරු මැතිවරණයට තරඟ කිරීමට අවකාශ ඇත. මෙවැනි අවස්ථාවක දී, අතුරු මැතිවරණය පවත්වනු ඇත්තේ, දිස්ත්‍රික්කයේ වැඩිම ඡන්ද සංඛ්‍යාව ලැබූ අපේක්ෂකයා ජයග්‍රහණය කිරීමේ මූලධර්මයට අනුවයි.

IV. අගමැති, විපක්ෂ නායක, ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාමලත් විනිශ්චයකරුවන් දෙදෙනෙකු, මහ ඇමතිවරුන්ගේ සම්මේලනයේ සභාපති, පාර්ලිමේන්තුවේ කථානායක සහ පාර්ලිමේන්තුවේ නියෝජනය වන දේශපාලන පක්ෂවල නියෝජිතයින්ගෙන් සමන්විත ව්‍යවස්ථා සභාවක් පිහිටුවනු ඇත. රාජ්‍ය සේවා කොමිසමේ සාමාජිකයින්, අල්ලස සහ දූෂණය පිළිබඳ ස්ථාවර කොමිසම, රාජ්‍ය භාෂා කොමිසම සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම යන මේවායේ සාමාජිකයින් පත් කිරීම, ව්‍යවස්ථා සභාවේ වගකීම වනු ඇත. මැතිවරණ කොමසාරිස් සහ නීතිපති තනතුරු වලට අගමැතිවරයා විසින් නම් කරනු ලබන අතර, එම නාම යෝජනා වලට ව්‍යවස්ථා සභාවේ අනුමැතිය ලැබිය යුතුය. ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයින්ගේ ධුර කාලය, දේශපාලන මැදිහත් වීමෙන් ආරක්ෂා කෙරෙනු ඇත.

V. මානව අයිතිවාසිකම් වෙනුවෙන් හුදෙක් කතා කරනවාට වැඩියෙන් බොහෝ දේවල් ඇත්තටම කිරීමේ අවශ්‍යතාවය පිළිගත්තා පොදුජන එක්සත් පෙරමුණ පාර්ලිමේන්තු පනත් අධිකරණ විමර්ශණයට භාජනය කිරීමේ මූලධර්මය නව ව්‍යවස්ථාවට ඇතුළත් කරනු ඇත. පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ නීති, ව්‍යවස්ථාවේ ගැබ් වන මූලික අයිතිවාසිකම් පිළිබඳ විධිවිධානයන්ට පටහැනි වන්නේ නම්, ඒවා අවලංගු කිරීමේ අධිකරණ බලය, ශ්‍රේෂ්ඨාධිකරණය සතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණ බලයේ කොටසක් වනු ඇත. මානව අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් ඇතිවන ආරවුල් සමථයකට පත් කිරීමට මානව අයිතිවාසිකම් අධ්‍යක්ෂවරයා පළමුවෙන් කටයුතු කරනු ඇත. එම ප්‍රයත්නය සාර්ථක නොවූ විට, පීඩාවට පත් පාර්ශ්වයන්ට මානව අයිතිවාසිකම් කොමිසමේ සේවය ලබාගත හැකි අතර, ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පැවරීමට අවශ්‍ය පියවර එම කොමිසම විසින් ගනු ඇත.

VI. මැතිවරණ නිතිරීතිවල කවර අංගයක් හෝ මහජන ආරක්ෂක පනත යටතේ පණවා ඇති හදිසි අවස්ථා රෙගුලාසි වල මුවාවෙන් වෙනස් කිරීමට ආණ්ඩුවට ඇති බලය අහෝසි කරනු ඇත. මැතිවරණ සම්බන්ධ නීති පැණවීම සහ වෙනස් කිරීම සම්පූර්ණයෙන් ම පාර්ලිමේන්තුවට පමණක් පැවරෙන කාර්යයක් වනු ඇත. නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම සහතික කරනු සඳහා, විශේෂයෙන් ම, ඡන්ද කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය නියෝග පොලිසියට නිකුත් කිරීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා සතු බලය ශක්තිමත් කරනු ඇත.

## අල්ලස සහ දූෂණය

අපේ දේශපාලන සංස්කෘතියේ අද ඇති මූලික නම ප්‍රශ්නයක් නම්, මහජන ජීවිතයේ සෑම අංගයකම පාහේ, පෙර නොවූ විරූ මට්ටමකින් පැතිරී ඇති අල්ලස සහ දූෂණයයි. වත්මන් එ. ජා. ප. පාලනය විසින් හිතාමතා තම වාසිය තකා ස්ථාපිත කරන ලද මෙම දූෂණය ශ්‍රී ලංකාවේ මුළු සමාජයම බිලිගත්, කවදාවත් නැති ලෙස උග්‍රවී ඇති වසංගතයකි. සදාචාරය, විනය ගරුත්වය සහ සාධාරණය පිළිබඳ සියළුම මූලධර්මයන් හිතාමතාම මහජන ජීවිතයෙන් ඉවත් කිරීම නිසා මහජනතාව තුළ ඇති වී තිබෙන්නේ අපේක්ෂා භංගත්වයක් සහ පිළිකුලකි. අසීමිත කෑදරකම සහ සදාචාරාත්මක මිනුම් දඬු රහිත දේශපාලන ක්‍රමයක් පැන නැගී තිබීම, එ. ජා. ප. 17 වසරක පාලනයේ ඛේදනීය සිහිවටනයකි.

මේ විනාශකාරී ප්‍රවණතාවය නැවැත්වීමටත්, අප රටේ මහජන ජීවිතයේ යහපත් සහ ගුණගරුක හරයන් පුනර්ජීවනය කිරීමටත් පියවර ගැනීමට පොදු ජන එක්සත් පෙරමුණ අධිෂ්ඨාන කරගෙන සිටී. අපේ දේශපාලන සහ පරිපාලන ක්‍රමය පිළිබඳ මහජන විශ්වාසය යළි ගොඩ නැගීම සඳහා අප යෝජනා කරන ක්‍රියා මාර්ගය නම්, අල්ලස හා දූෂණය පිළිබඳ ස්ථාවර කොමිසමක් පත් කිරීමයි. අළුත් ආණ්ඩුව බලයට පත්වී තුන් මසක් ඇතුළතදී මේ කොමිසන් සභාව පිහිටුවන බව පොදු ජන එක්සත් පෙරමුණ මහජනතාවට සහතික වෙයි.

හිටපු අල්ලස් කොමසාරිස් නෙළුම් ගමගේ මහත්මිය මාරු කිරීම පිළිබඳ සිදුවීමෙන් මැනවින් පෙන්නුම් කරන කරුණක් නම්, ආණ්ඩුවේ අනුග්‍රහය ලබන ප්‍රධාන පෙළේ දේශපාලනඥයින්ට විරුද්ධව තිබෙන අල්ලස් හා දූෂණ චෝදනා විභාග කිරීමට දැනට තිබෙන ක්‍රියා පරිපාටිය ඉතා දුර්වල සහ ප්‍රමාණවත් නොවන බවයි. දැනට පවතින අල්ලස් කොමසාරිස් ධුරය දේශපාලන බලපෑම්වලට යටත්වන සුළු එකක් බව පැහැදිළිය.

මේ පසුබිම තුළ, පොදුජන එක්සත් පෙරමුණේ ස්ථාවරය වන්නේ අල්ලස් හා දූෂණය පිළිබඳ ස්ථාවර කොමිසමේ සාමාජිකයින් පත් කිරීමේ බලය තිබිය යුත්තේ බලයේ සිටින ආණ්ඩුවට නොවන එක් තනි දේශපාලන පක්ෂයකට පක්ෂපාත නොවන සාමාජිකයින්ගෙන් සමන්විත ව්‍යවස්ථා සභාව වෙතය යන්නයි. අල්ලස් සහ දූෂණය පිළිබඳ ස්ථාවර කොමිසමට සාමාජිකයන් පත් කරනු ලබන්නේ ව්‍යවස්ථා සභාව විසිනි.

අල්ලස් සහ දූෂණය පිළිබඳ ස්ථාවර කොමිසම සාමාජිකයින් තිදෙනෙකුගෙන් (03) සමන්විත වනු ඇත. එයින් දෙදෙනෙකු ශ්‍රේෂ්ඨාධිකරණයෙන් විශ්‍රාම ලත් විනිශ්චයකාරවරුන්ය. කොමිසමේ සභාපති වනු ඇත්තේ එයින් කෙනෙකි.

කොමිසමේ සාමාජිකයින් ඉටු කරන කාර්ය භාරය ඉතා සංවේදී සහ බැරෑරුම් එකක් නිසා, එහි සාමාජිකයින්ට, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර වරුන්ට ලැබෙන ධූර කාලය පිළිබඳ ආරක්ෂාව සහ අනිකුත් ආරක්ෂාවන් ලැබෙනු ඇත. කොමිසම කෙලින් ම පාර්ලිමේන්තුවට වාර්තා කරයි. විෂමාචාරය හැර අන් හේතුවක් නිසා කොමිසමේ සාමාජිකයින් ධූරයෙන් ඉවත් කළ නොහැකිය. එවැනි අවස්ථාවක දී ධූරයෙන් ඉවත් කිරීමේ යෝජනාව පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක වැඩි ඡන්දයෙන් සම්මත විය යුතුය. කොමිසමේ සාමාජිකයින්ගේ වැටුප ඒකාබද්ධ අරමුදලින් වැය වන අතර, එම වැටුප් ඔවුන්ගේ ධූර කාලය තුළදී අඩු කළ නොහැකිය. මෙ විධිවිධානයන් නිසා අල්ලස් හා දූෂණය පිළිබඳ ස්ථාවර කොමිසමට අපක්ෂපාතිව සහ නොබියව ක්‍රියා කිරීමට හැකි වනු ඇත. මෙම ස්ථාවර කොමිසම ක්‍රියා කරනු ඇත්තේ, වරින් වර ඇතිවන අවශ්‍යතාවන්ට අනුව නොව අඛණ්ඩ පදනමක් අනුවය. කොමිසම විසින් කරනු ලබන පරීක්ෂණයන් නිසා බලගතු දේශපාලඥයින් අපහසුතාවයට හෝ කෝපයට පත්වීම නිසා, එ. ජා. ප. ය නිර්ලජ්ජි ලෙස කළ පරිදි කොමිසමේ කටයුතු නොනවත්වනු ඇත. ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතේ දැනට ඇති දුර්වලතම, එනම් ආණ්ඩුව කැමැති අවස්ථාවල කොමිසන් සභා වල කාලය දිර්ඝ නොකිරීම යන කොන්දේසි පොදුජන එක්සත් පෙරමුණ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධන මගින් අහෝසි කරනු ඇත.

අතිශයින් ම ජාතික වැදගත්කමකින් යුත් වගකීමක් එලදයි ලෙස ඉටු කිරීම සඳහා කොමිසන් සභාව ස්වාධීන වීම පමණක් ප්‍රමාණවත් නැත. තම කාර්යයන් කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා පහසුකම් ද එයට තිබිය යුතු ය. ඒ අනුව පරීක්ෂණ සහ නීතිමය වශයෙන් පළපුරුදු ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් කොමිෂන් සභාවට ලබාදෙන අතර, කාර්ය මණ්ඩලයේ වැටුප් ද ඒකාබද්ධ, අරමුදලට වැය කෙරෙනු ඇත. කොමිෂන් සභාවේ කාර්යයන් දෙවැදෑරුම් වනු ඇත. එවා නම්,

i. පරීක්ෂණ පැවැත්වීම සහ
ii. චෝදනා ලැබූවන්ට විරුද්ධව නඩු පැවරීම යි.

නඩු පැවරීමේ කාර්යය පැවරෙන්නේ නීතිපති දෙපාර්තමේන්තුවට නොවේ.

කොමිසමට අධිකරණ බලතල නොලැබේ. විශේෂ අල්ලස් උසාවි හෝ අධිකරණ සභා පිහිටුවීමේ අදහස ගැන පොදුජන එක්සත් පෙරමුණ විශ්වාස කරන්නේ ද නැත. අල්ලස් සහ දූෂණය පිළිබඳ වැරදි වලට අදාළ නඩු විභාග කරන ආයතනය වනු ඇත්තේ මහාධිකරණයයි.

අල්ලස් සහ දූෂණ ක්‍රියාවල මහා පරිමාණයෙන් යෙදෙන ' මෝරුන් 'දේශපාලන රැකවරණ ලබාගෙන යහතින් සිටිද්දී, නීතියේ රැහැනට හසුව උසාවිය ඉදිරියට ගෙන එන්නේ 'හාල්මැස්සන් ' පමණක් ය යන මතය, අපේ සමාජයේ මුල් බැසගෙන තිබේ. එසේ වීමට සාධාරණ හේතු ද තිබේ. මේ තත්වය නැති කිරීමට අපි පියවර ගනිමු. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පළාත් සභා මන්ත්‍රීවරුන්, පලාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වල නිලධාරීන් පිළිබඳ අල්ලස් චෝදනා පරීක්ෂා කිරීමේ පුළුල් වරමක් සහ බලතල අල්ලස් හා දූෂණය පිළිබඳ ස්ථාවර කොමිසමට ලබාදෙමු. මේ සෑම කෙනෙකු ම, සෑම අවුරුද්දක දී තම වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රසිද්ධ ප්‍රකාශයන් කළ යුතුය. මෙතෙක් කල් පරීක්ෂණයට භාජනය නොවූ බලසම්පන්න පුද්ගලයන් කොමිෂම විසින් පරීක්ෂණයට ලක් කිරීම මගින්, එක්සත් ජාතික පක්ෂ පාලනයේ සුවිශේෂ ලක්ෂණයක් වූ, බලගතු දේශපාලනඥයන්ට හා ඔවුන්ගේ හිතවතුන්ට එක් ලෙසකිනුත් සාමාන්‍ය පුරවැසියන්ට තවත් ලෙසිකිනුත් සැළකූ දෙබිඩි ප්‍රතිපත්ති අහෝසි කිරීමට තුඩු දෙනු ඇත.

අල්ලස්ට හා දූෂණයට විරුද්ධ සටනේ දී සෑම දෙනාට ම එක සමාන මිණුම් දඬු ඇති කරනු පිණිස, පාර්ලිමේන්තු වරප්‍රසාද යටතේ දැනට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සතු ආරක්ෂාව අප්‍රමාදව ඉවත් කිරීමට අපි පියවර ගනිමු. දැනට පවත්නා නීතියට අනුව, අල්ලස් කොමසාරිස් වරයා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු පිළිබඳව තිබෙන අල්ලස් චෝදනා ගැන පරීක්ෂණ පැවැත්වීමට පෙර, ඒ සඳහා කථානායකතුමාගේ අවසරය ලබාගත යුතුය. මේ නීතිමය අවශ්‍යතාවය අපි වහාම අහෝසි කරමු. මේ අනුව අල්ලස් චෝදනා පරීක්ෂණයක් යටපත් කිරීමට කථානායක වරයාට නොහැකි වනු ඇත.

අල්ලස් සහ දූෂණය වැළැක්වීමේ තවත් පියවරක් වශයෙන්, ඒ වෙනුවෙන් පණවනු ලබන දඬුවම් වැඩි කෙරෙන අතර, සුදුසු තන්හි දී අවම දඬුවම් මට්ටම් ද නියම කෙරෙනු ඇත.

ප්‍රකාශ කොට ඇති ආදායම් සමග නොපැසඳෙන වත්කම් අත්පත් කරගෙන ඇති පුද්ගලයන් පිළිබඳ මහජනතාවගෙන් තොරතුරු ලබා ගැනීමට කොමිසන් සභාවට බලය පැවරේ. තොරතුරු සහ පුද්ගලයින් පිළිබඳ රහස්‍ය භාවය ආරක්ෂා කරනු පිණිස සුදුසු නීතිමය සීමාවන්ට යටත්ව එම රහස්‍ය භාවය රකින නීති සම්පාදනය කෙරේ. ප්‍රයෝජනවත් තොරතුරු සැපයීම වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදනයක්ද කරනු ඇත. ඒ සමඟ ම සිතා මනාම ව්‍යාජ තොරතුරු සපයන පුද්ගලයන්ට දැඩි දඬුවම් ද පමුණුවනු ඇත. නීති විරෝධී ලෙස මෙරට හෝ පිටරට වත්කම් එකතු කර ඇතැයි තහවුරු වූ අවස්ථාවන් හි දී, මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා එම වත්කම් මහා භාණ්ඩාගාරය වෙත පවරාගනු ඇත.

දූෂණය ශ්‍රී ලංකාවේ ප්‍රගතියට, ස්ථාවරභාවයට හා යහ පැවැත්මට මහත් හානි පමුණුවයි. මේ වන විට දූෂණය කෙතරම් පරිමාවකින් සහ නිරතුරුව ම සිදුවන්නේ දැයි කිවහොත්, අපේ සමාජයේ සදාචාරාත්මක පදනම් පිළිබඳවත්, අපේ සමාජමය හර පද්ධතියේ ගුණාත්මක පැත්ත ගැනත් අතිමූලික ප්‍රශ්න මතු වෙයි. අල්ලස් සහ දූෂණය පිළිබඳ ස්ථාවර කොමිසන් සභාවක් පිහිටුවීමට නීතිමය පියවර වහාම තැබීම, අප රටේ මහජන ජීවිතයේ සදාචාරය, විවෘත බව සහ වගකීම පිළිබඳ මිණුම් දඬු යළි පණ ගැන්වීමට හා පියළු උතුම් මිනිස්කම් මුදලට යට කිරීම නවතාලීමට ද ක්ෂණිකව ම අවශ්‍ය පියවරක්ය යන්න පොදුජන එක්සත් පෙරමුණේ විශ්වාසයයි.

# රාජ්‍ය සේවය

වත්මන් යූ. ඇන්. පී. පාලන තන්ත්‍රයන් යටතේ බෙහෙවින් ම පලුදු වී ගොස් ඇති, රාජ්‍ය සේවයේ ගෞරවය සහ ආත්ම ගරුත්වය ප්‍රතිෂ්ඨාපනය කිරීම, සාතිශය වැදගත්කමකින් යුතු අරමුණකි.

අපේ රාජ්‍ය සේවයේ යෙදී සිටින නිලධාරීන්ට අවංකවම, ඍජුව සහ හෘදය සාක්ෂියට එකඟව රාජකාරි කිරීමට අවශ්‍ය පසුබිම ගොඩනගනු පිණිස පොදුජන එක්සත් පෙරමුණ ක්‍රියාත්මක කරන ප්‍රතිපත්තියේ මුල්ගල වනු ඇත්තේ, සැබැවින් නිවහල් හා ස්වාධීන රාජ්‍ය සේවා කොමිසන් සභාවක් පිහිටුවීමයි.

රාජ්‍ය සේවයේ සෑම ශ්‍රේණියකම නිලධාරීන්ගේ ඉරණම දේශපාලනඥයින්ගේ හිතුමතාපයට අනුව තීරණය වූ කාලකණ්ණි යුගය අවසන් කිරීම අරමුණු කරගත් විධි විධාන මාලාවක් ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකතු කිරීමට, පොදු ජන එක්සත් පෙරමුණ අදිටන් කරගෙන සිටියි. ව්‍යවස්ථා සභාව විසින් අවුරුදු පහක කාලයක් සඳහා පත් කරනු ලබන රාජ්‍ය සේවා කොමිසමට, මහජන විශ්වාසය රැකෙන පරිදි, අපක්ෂපාතීව සහ ඵලදායී ලෙස සිය කටයුතු කිරීමට ඉඩ සලසා දෙන පරිදි එයට ව්‍යවස්ථාමය ආරක්ෂාව සහතික කෙරේ. ඒ අනුව කොමිසමේ සාමාජිකයින් ගේ වැටුප් ඒකාබද්ධ අරමුදලෙන් වැය වන අතර, එම වැටුප් කොමිසමේ ධූර කාලය තුල දී අඩු කළ නොහැකිය. විෂමාචාරය හැර අන් කිසිදු හේතුවක් නිසා, ඔවුන් ධූරයෙන් ඉවත් කිරීමට ද නොහැකිය. විෂමාචාර චෝදනාවක් යටතේ පවා කොමසාරිස්වරයකු ධූරයෙන් ඉවත් කෙරෙන්නේ නම්, එය කළ හැක්කේ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක වැඩි ඡන්දයෙන් සම්මත වන හරයාත්මක යෝජනාවක් අනුව පමණි.

රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ කටයුතු අධීක්ෂණයට ලක් කිරීමේ ඵලදයි ක්‍රියාමාර්ගයක් හැටියට මහජන දුක් ගැනවිලි පිලිබඳ කොමසාරිස් ධූරයට (ඔම්බුඩ්ස්මන් ධූරය) නව ජීවයක් සහ ශක්තියක් ලබාදීමට, පොදුජන එක්සත් පෙරමුණ ක්‍රියා කරනු ඇත. එහි ජීවයක් සහ ශක්තියක් ලබාදීමට, පොදුජන එක්සත් පෙරමුණ ක්‍රියා කරනු ඇත. එහි ආරම්භක පියවරක් වශයෙන්, ශ්‍රී ලංකාවේ දැනට පවතින එක් ඔම්බුඩ්ස්මන් වරයෙකු වෙනුවට, බ්‍රිතාන්‍යයේ සහ වෙනත් පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් කිහිපයකම ඇති පරිදි, රාජ්‍ය පරිපාලනයේ විවිධ ක්ෂේත්‍ර භාරව ඔම්බුඩ්ස්මන් වරුන් ගණනාවක් ම පත් කරනු ඇත. උදාහරණයක් වශයෙන්, පොලිස් නිලධාරීන්, සහ රාජ්‍ය බැංකු සේවකයින් ඉදිරිපත් කරන පැමිණිලි සහ දුක් ගැනවිලි පරීක්ෂා කිරීමට වෙන වෙනම ඔම්බුඩ්ස්මන් වරුන් පත් කරනු ඇත. දේවනුව දේශපාලන බලපෑම් මත හෝ යුක්තිය පැහැර හැරීම හෝ නිසි ක්‍රියාපටිපාටිය උල්ලංඝණය කිරීම නිසා හේ තමන්ට අවාසියක් සිදු වී ඇතැයි හැඟෙන ඕනෑම රාජ්‍ය සේවයෙකු ට, අදාළ ඔම්බුඩ්ස්මන් වරයා වෙත කිසිම බාධාවකින් තොරව පැමිණිලි කිරීමට හැකිවනු ඇත. මේ මගින් දැනට පවත්නා, පාර්ලිමේන්තු කොමිෂන් මාර්ගයෙන් පැමිණිලි ඉදිරිපත් කිරීමේ ඉතාම අසතුටුදායක සහ ආණ්ඩු පක්ෂයට පාර්ලිමේන්තුවේ ඇති වැඩි ඡන්දය මගින් එවැනි පැමිණිලි ඉදිරිපත් වීම වැළැක්වීමට ඉඩකඩ ලබාදෙන ක්‍රමය අහෝසි වනු ඇත.

රාජ්‍ය සේවයේ එක් එක් අංගයේ ඇති වෘත්තිය දක්ෂතා සහ ගෞරවය ,පිළිබඳ හැඟීම නිරන්තරයෙන් ම සහ අධිෂ්ඨානශීලී ලෙස පෝෂණය කරනු ඇත. දේශපාලන ණය පියවීමේ මාර්ගයක් හැටියට හෝ දේශපාලන වාසි ලබාදීමේ උපකරණයක් හැටියට හෝ රාජ්‍ය සේවයේ කිසිදු අංගයක් අයුතු ලෙස පාවිච්චි කිරීමට දේශපාලනඥයින්ට ඉඩ නොලැබේ.

රාජ්‍ය සේවයේ ගරුත්වය සහ විවෘත බව ආරක්ෂා කිරීමට අප සතු කැපවීමේ ප්‍රායෝගික ප්‍රකාශනයක් හැටියට, අල්ලස සහ දූෂණය පිළිබඳ ස්ථාවර කොමිෂන් සභාව පත් කරන තුරු, නෙළුම් ගමගේ මහත්මියට ඇයට සාධාරණ ලෙස හිමි අල්ලස් කොමසාරිස් ධූරය වහාම යළි ලබා දෙන්නෙමු.

# නාස්තිය සහ අනවශ්‍ය වියදම් නැති කිරීම

දේශපාලන බලය පිළිබඳ ඇති ඉතාම වැදගත් මූලධර්මයක් නම්, එය අයිතිවාසිකමක් හෝ ප්‍රදානයක් හෝ නොව, හුදෙක් භාරකාරත්වයක් පමණක්ය යන්නයි. දේශපාලන බලය සහ අධිකාරය සදාචාරාත්මක ලෙස සාධාරණීකරණය කළ හැක්කේ, එම බලය සමස්තයක් වශයෙන් ප්‍රජාවගේ යහපත වෙනුවෙන් යොදවන්නේ නම් පමණි. ක්‍රියාත්මක ප්‍රජාතන්ත්‍රවාදයක් තුළ දේශපාලන බලය යනු ජනතාවට සේවය කිරීමේ උපකරණයකට වඩා වැඩි හෝ අඩු දෙයක් නොවේ.

නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ හරය වන මෙම අදහස් එ. ජා. ප. යේ පාලන තන්ත්‍රයන් නිරන්තරයෙන් ම ක්‍රියාත්මක කළ ප්‍රතිපත්ති වලට හාත්පසින් ම විරුද්ධ ඒවාය. අවුරුදු 17 ක් ම බලයේ සිටීම නිසා එ. ජා. ප ය තුළ පැලපැදියම් වී ඇත්තේ, අප රටේ දේශපාලන අත්දැකීම් කවදවත් නොතිබුණු ආකාරයේ බලයෙන් ඉදිමීමත්, අසංවේදී බවත් සහ ජනතාවගේ ප්‍රශ්න ගණන් නොගැනීමේ උදාසීන මානසිකත්වයකි.

අප රටේ ඇමතිවරු 91 ක් සිටිති. මේ සංඛ්‍යාව අනෙකුත් රටවල් සමග සසඳා බැලීම වටී. ඉන්දියාව ලංකාවට වඩා 90 ගුණයක් භූමි ප්‍රමාණයෙන් විශාල ය. අපේ රටේ ජනගහණය දශ ලක්ෂ 18 ක් වෙද්දී, ඉන්දියාවේ ජනගහණය දශ ලක්ෂ 920 කි. එහෙත් ඉන්දියාව, ඇමතිවරු 53 දෙනෙකුගෙන් සෑහීමට පත් වී ඇත. දශ ලක්ෂ 120 ක ජනගහණයක් ඇති පකිස්ථානයේ ඇත්තේ ඇමතිවරුන් 16 දෙනෙකි.

ඉතා පොහොසත් රටක් වන ඇමරිකාවේ කැබිනට් මණ්ඩලයේ ප්‍රමාණය ගැන සිතා බැලීම මෙහි දී වැදගත්ය. 1789 දී එහි සිටියේ ඇමතිවරුන් 5 කි. 1840 දී 7 කි. 1901 දී 09 කි. 1913 දී 10 කි. 1945 දී 11 කි. අද ඇමෙරිකා එක්සත් ජනපදයේ කැබිනට් ඇමතිවරුන්ගේ මට්ටමේ ලා සැලකිය හැකි අය 20 කට වැඩි නොවේ. මෙහි තේරුම නම්, ඇමතිවරුන්ගේ සංඛ්‍යාව රටේ ජනගහනය අනුව සසඳා බලන විට, ඇමෙරිකා එක්සත් ජනපදයේ එක් ඇමතිවරයෙකු, ලංකාවේ මුළු ජනගහණයටත් වඩා විශාල සංඛ්‍යාවක ඇමෙරිකානු පුරවැසි පිරිසක් නියෝජනය කරන බවයි.

පාලන පක්ෂයේ දේශපාලනඥයින්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීමට මහජන මුදල් සම්භාරයක් අපරාධකාරී ලෙස යොදා ගැනීම නිසා, යූ. එන්. පී. ආණ්ඩුව දක්වා ඇති වගකීම් විරහිත සහ අශිෂ්ට වාර්තාව ලෝකයේ වෙන කිසිම රටක දක්නට නොලැබෙන්නෙකි. ඇමතිවරු 91 දෙනාට පඩි සහ දීමනා ගෙවීමට පමණක් වාර්ෂිකව රුපියල් දශ ලක්ෂ (මිලියන) දෙදහසකට අධික මුදලක් වැය කෙරෙනු ඇත.

පොදුජන එක්සත් පෙරමුණේ ආණ්ඩුවක විසි දෙනෙකුට වඩා ඇමතිවරුන් පත් නොකරන බවට අපි ජනතාවට ප්‍රතිඥා දෙමු. මේ මගින් ඉතිරි කරනු ලබන සම්පත් මහජන සුභසාධනය සඳහා යොදවනු ඇත.

ඇමතිවරුන් සහ මන්ත්‍රීවරුන් බි. එම්. ඩබ්ලිව් සහ බෙන්ස් කාර්වල සුඛෝපභෝගී ලෙස ගමන් කළ කාලය අවසන් වනු ඇත. ඔවුන්ට ලැබෙනු ඇත්තේ, ඔවුන් ඉටු කරන මහජන සේවයට ප්‍රමාණවත් වන, අනවශ්‍ය විශාලත්වයෙන් සහ සුඛෝපභෝගී බවෙන් තොර වාහනයකි. මහජන සේවයට කැපවුණු පුද්ගලයින්, මහජනයාගේ ම වියදමින් සැප විහරණයෙන් යුත් ජීවිත ගත නොකළ යුතුය යන්න පොදුජන එක්සත් පෙරමුණේ විශ්වාසය යි. පාලක පක්ෂය ජනතාව ගැන කිසිදු තැකීමකින් තොරව හැන්ද අත තබාගෙන තමන්ගේ ම පිගානට බෙදා ගත් යුගය අවසන් වනු ඇත.

# ජනවාර්ගික ප්‍රශ්නය

සිංහල බෞද්ධ බහුතරයේ අයිතීන් තහවුරු කර, ආරක්ෂා කරන අතර, අප රටේ ජීවත් වන සියළු ජාති, ආගම්වලට අයත් කොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කර දීම අප රජයේ පරම යුතුකමක් සේ සළකමු. මිනිස් අයිතිවාසිකම්, ආර්ථික, සමාජයීය අයිතීන් සියළු ජාතීන්ට එක හා සමානව සතුවිය යුතු බව අපි විශ්වාස කරමු.

ජනවාර්ගික ප්‍රශ්නය අපේ රටේ ක්ෂණිකව විසඳිය යුතු සංකීර්ණ ප්‍රශ්න අතරින් මුල්තැන ගන්නා එකක් බවත්, එම ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් සැපයීම මගින් සාමය යළි ගොඩ නැගුමකින් තොරව රටේ ආර්ථික වර්ධනය, සමාජ ප්‍රගතිය හා දේශපාලන ස්ථාවර භාවය පිළිබඳ අරමුණු සාක්ෂාත් කර ගත නොහැකි බවත්, පොදුජන එක්සත් පෙරමුණ විශ්වාස කරයි. ජනවාර්ගික යුද්ධය නිසා විනාශ වූ ජීවිත හා දේපොල ප්‍රමාණයත්, රටේ ප්‍රගතියට ඇති වූ බාධාවත් සැළකිල්ලට ගන්නා අපි සියළු ජන කොටස්වල අභිවෘද්ධියට හේතුවන සාමකාමී වාතාවරණයක් අප්‍රමාදව රටේ ඇති කරනු පිණිස ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුමක් සෙවීම පිණිස අවශ්‍ය සෑම පියවරක් ම ගැනීමට පොදුජන එක්සත් පෙරමුණ කැපවී සිටී. එසේ විසඳුමක් කරා ළගාවීම මගින් යුද්ධය වෙනුවෙන් වැය වන විශාල සම්පත් ප්‍රමාණය අප රටේ සෑම ජන කොටසකම සුභසිද්ධිය වෙනුවෙන් යෙදවීමටත්, රටේ නීතිය හා සාමය සහ දේශපාලන ස්ථාවර භාවය රැකීමටත් අදහස් කරමු.

අවශ්‍ය සහ ප්‍රමාණවත් ලෙස බලය බෙදා හැරීමට අපි ඇප කැප වී සිටිමු.

ජනවාර්ගික ප්‍රශ්නයට සහ බලය බෙදා හැරීම සම්බන්ධව දීර්ඝකාලීන විසඳුමක් ඇති කර ගනු පිණිස භූගෝලීය, ආර්ථික හා සමාජමය සාධකයන් ද සැළකිල්ලට ගෙන නව පරිපාලන ඒකක ගොඩ නැගීමට අපි කටයුතු කරන්නෙමු.

බලය බෙදා හැරීම කෙරෙන නව ඒකක පිහිටුවීම සඳහා අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ඉදිරිපත් කිරීමේදී පිළිගත හැකි විසඳුමකට ඒම අරමුණු කොටගෙන සෑම ජනවාර්ගික කණ්ඩායමකම අදහස් විමසා බැලීමට අවශ්‍ය පියවර ගනු ඇත.

## ආර්ථික ප්‍රතිපත්ති

නිදහස් ආර්ථික රාමුවක් තුළ ශක්තිමත් දේශීය ආර්ථිකයක් ගොඩනැගීම පොදුජන එක්සත් පෙරමුණේ අභිප්‍රායයි. මේ කාර්යය ඉටු කර ගැනීමේදී දේශීය හා විදේශීය පෞද්ගලික අංශයට වැදගත් කාර්යභාරයක් හිමි වනු ඇත. එමෙන්ම දේශීය හා විදේශීය තාක්ෂණය, විද්‍යාත්මක දැනුම, මූල්‍යමය සහ ද්‍රව්‍යමය සම්පත් ද උපයෝගී කරගනු ඇත.

අපේ ප්‍රයත්නය වන්නේ නිදහස් සහ ප්‍රජාතන්ත්‍රවාදී වාතාවරණයක් තුළ ප්‍රායෝගික, සමබර, විනයානුකූල සහ සුනම්‍ය ආර්ථිකයක් ගොඩ නැගීමය.

ස්ථාවර සහ ශක්තිමත් ආර්ථික සංවර්ධනයක පදනම වනු ඇත්තේ ශක්තිමත් දේශීය කාර්මික නිෂ්පාදන පදනමක් පැවතීම යයි අපි විශ්වාස කරමු. එබැවින් දේශීය අමු ද්‍රව්‍ය සහ සම්පත් පදනම් කරගත් කාර්මික අංශය ශක්තිමත් කිරීමටත්, වර්ධනය කිරීමටත් අපි විශේෂ පියවරයන් ගන්නෙමු.

## අපේ ආර්ථික පිළිවෙතේ වැදගත් අංශයන් මෙසේය

1. දැනට ටික දෙනෙකුට පමණක් වාසි සැලසෙන පරිදි පවතින අසංවිධිත ආර්ථික ක්‍රමය වෙනුවට, ජාතික අරමුණු සහ ප්‍රමුඛතා සැලකිල්ලට ගෙන පැහැදිලි ආර්ථික ප්‍රතිපත්ති මාලාවක් සකස් කරන්නෙමු. රාජ්‍ය හා පෞද්ගලික අංශවල සහභාගිත්වය ඇතිව මේ කාර්යය කෙරෙනු ඇත.

2. තාක්ෂණය, විද්‍යාත්මක අභිවෘද්ධිය, ආයෝජන, කළමනාකරණය සහ මූල්‍ය සහ රැකියා නියුක්තිය යන ක්ෂේත්‍රයන් තුළ වේගවත් වර්ධනයක් ඇති කර ගැනීම උදෙසා දේශීය හා විදේශීය ආයෝජනයන්ට සියළු පහසුකම් ලබා දෙන්නෙමු.

3. වෙළඳ පොල ආර්ථිකය සියළු දෙනාටම එකසේ විවෘත විය යුතුය. මෙය සහතික කිරීම පිණිස ආර්ථික කටයුතු මහජන පරීක්ෂාවට වගකීමකින් යුතුව විවෘතභාවයේ සහ වගකීමේ සියළු මූලධර්ම වලටත් අනුව සිදුවන බවට අප වග බලා ගන්නෙමු. අද රටේ පවතින "හෙංචයියන්ගේ සහ කොමිස් කාක්කන්ගේ ධනපති ක්‍රමය" ඒ මගින් මුලිනුපුටා දැමෙනු ඇත.

4. පෞද්ගලික අංශයට සතුටුදායක ලෙස කළ හැකි සියළු ආර්ථික කටයුතුවල යෙදීම සඳහා ඔවුන්ට පූර්ණ නිදහස ලබා දෙනු ඇත. වෙළඳ පොලේ බලවේග හා මිළ ගණන් අනුව රජයේ පාලන නීති රීති වලින් තොරව මෙම කටයුතුවල යෙදීම සඳහා පෞද්ගලික අංශයට පහසුකම් සළසනු ඇත. ඒ යටතේ ආනයනය අනවශ්‍ය ලෙස සීමා නොකෙරේ. මේ කටයුතු වල වගකීම හා විවෘත භාවය සහතික කිරීම සඳහා අවශ්‍ය නිතිමය රාමුවක් සකස් කිරීම රජයේ කාර්ය භාරයේ කොටසක් ලෙස අපි පිළිගනිමු.

5. පෝලිම් යුගයක් හා භාණ්ඩ හිඟයක් අපේ පාලනය යටතේ ඇති නොවන අතර මහජනයාට අවශ්‍ය භාණ්ඩ විවෘත වෙළඳපොලෙහි පහසුවටත්, අඩු මිලටත් ලබා ගැනීමට අවශ්‍ය විධිවිධාන යොදනු ඇත.

6. රජය හා රජයේ නිලධාරීන් රටේ ආර්ථික කටයුතු හරියාකාරව ඉටු කිරීම තුළින් මුළු රටේ ම සංවර්ධනය සාර්ථකව ඉටු කර ගැනීම එකම පරමාර්ථය වන අතර, තම තමන්ගේ පෞද්ගලික ලාභ හා අභිමතාර්ථ ඉටු කර ගැනීම පිණිස සිදුවිය හැකි ඇල්ලස් හා කොමිස් ගැහීමේත්, දූෂණ සිදු කිරීමේත් සම්ප්‍රදාය සහමුලින්ම ඉවත් කරනු ඇත.

7. නිදහස් හා තරගකාරී ආර්ථිකයක මුල් අවධියේදී සමාජයේ දුගී ජනතාවට මුහුණ දෙන්නට සිදුවන දුෂ්කරතාවයන්ට පිළියම් වශයෙන් විශේෂ සහනාධාර වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන්නෙමු.

8. මනුෂ්‍යයින්ගේ ආත්ම ගෞරවයට කැළලක් වන "පිං පඩි දීමනා" වෙනුවට, ආර්ථික, දුෂ්කරතා ඇති දුගී දුප්පත් ජනතාවට අප විසින් ක්‍රියාත්මක කරනු ඇත්තේ, ඔවුන්ගේ නිෂ්පාදන හැකියාව සහ ආදායම් තිරසර ලෙස ඉහළ නැංවීමට ආධාර දෙන සැළසුම් සහිතව සකස් කළ සහනාධාර ක්‍රමයකි.

9. ජනතාවගේ එදිනෙද ජීවිතයට අත්‍යාවශ්‍ය සේවාවන් රජයේ පාලනය යටතේ පැවතීම අත්‍යාවශ්‍ය බවත්, එහෙත් කාර්යක්ෂම කළමනාකරණය සඳහා අවශ්‍ය ස්වාධීනත්වය එම ආයතනවලට තිබිය යුතු බවත් අපි විශ්වාස කරමු. මේ සේවාවන් වර්ධනය කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශවල සහභාගිත්වය ලබා ගන්නෙමු. මෙම අංශයන් නම්:

සෞඛ්‍යය, අධ්‍යාපනය, ජලය, විදුලිය, බලශක්ති බලාගාර, මහාමාර්ග සහ දුම්රිය මාර්ග, වාරිමාර්ග, ප්‍රධාන රාජ්‍ය බැංකු, රාජ්‍ය අංශයේ රක්ෂණ සංස්ථා, සතොස, වරාය අධිකාරිය හා නැව් සංස්ථාව, ගුවන් තොටුපලවල්, ගමනාගමනය, වතු වැවිලි අංශය, සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල සහ මහාභාරකාර අරමුදල යන මේවාය.

රාජ්‍ය සහ පුද්ගලික අංශ යන දෙකෙහිම සහභාගීත්වය ඇති කාර්යක්ෂම සහ තරඟකාරී ගමනාගමන සේවයක් ඇති කිරීම සඳහා ගමනාගමන අධිකාරියක් පිහිටවනු ඇත.

රාජ්‍ය අංශයේ ආයෝජන තවමත් මුල් තැන ගන්නා වැදගත් ජාතික සම්පතක් වන වැවිලි කර්මාන්ත අංශයේ කළමනාකරණය, පරිපාලනය සහ අධීක්ෂණය ජාතික අවශ්‍යතාවයන්ට සහ පරිසර අවශ්‍යතාවයන්ට ප්‍රමුඛත්වය ලැබෙන පරිදි ප්‍රතිසංශෝධනය සහ කාර්යක්ෂම කරනු ඇත.

10. ආණ්ඩුවේ එදිනෙද වියදම්වලට මුදල් සොයාගනු පිණිස, ලෝක බැංකුවේ උපදෙස් යන බොරු හේතුව මත, රාජ්‍ය අංශයේ ආයතන විකිණීමේ සහ පෞද්ගලික කරණය කිරීමේ, කිසිදු සැළැස්මක් නැති හිතුවක්කාර ප්‍රතිපත්තියක් එ. ජා. ප. ආණ්ඩුව ක්‍රියාත්මක කළ බව ජනතාවට රහසක් නොවේ. මෙහිදී දූෂණය, වංචාව සහ හිතවතුන්ට හා ගෝලයන්ට අනිසි වාසි ලැබීම සිදුවී ඇත්තේ මහා පරිමාණයෙනි. පොදුජන එක්සත් පෙරමුණ මේ අතීතය මුලිනුපුටා දැමීමට පොරොන්දු වෙයි.

11. ඉතිරි කිරීම් සහ ආයෝජන දිරි ගන්වන අතරම, උද්ධමනය පාලනය කරමින්, භාණ්ඩවල මිළ අඩු කිරීම අපේ අපේක්ෂාවයි. ආණ්ඩුවේ වියදම්, දැඩි මූල්‍ය විනය පාලනයකට හසු කරන්නෙමු.

12. දේශීය කාර්මික පදනමක් මත ආර්ථික සංවර්ධනයට ශක්තිමත් පදනමක් සපයනු පිණිස කාර්මික භාණ්ඩ නිෂ්පාදනය දියුණු කිරීමට අවශ්‍ය දිරි ගැන්වීම් සපයන්නෙමු. එසේම රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවා අංශයද දිරි ගන්වන්නෙමු.

13. දේශීය හා ජාත්‍යන්තර වෙළඳ පොලවල් ඉලක්ක කරගත් කාර්මික සහ කෘෂිකාර්මික නිෂ්පාදනයන්ට අවශ්‍ය යෙදවුම් මෙන්ම භාණ්ඩ සහ සේවාවන්ගේ මූර්ත නිෂ්පාදනය ඉහළ නැංවීමට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර හා වෙනත් ප්‍රාග්ධන භාණ්ඩ, නිදහස් වෙළඳ පිළිවෙතක් යටතේ ආනයනය කිරීමට පහසුකම් සැපයෙනු ඇත.

14. දේශීය තාක්ෂණය සහ දේශීය අමු ද්‍රව්‍ය යොදා ගන්නා කර්මාන්ත වලට උපරිම දිරි ගැන්වීම් ලබාදෙනු ඇත.

15. සෑම නිෂ්පාදන අංශයකම ධාරිතාව උපරිම මට්ටමට ගෙන ඒමටත්, ඒ මගින් දේශීය ආදායම් වර්ධනය කර ගැනීමටත් විශේෂ වැඩ පිළිවෙලක් සකස් කෙරේ.

16. කෘෂිකාර්මික සහ කාර්මික ක්ෂේත්‍රවල නව නිපැයුම් සහ ශිල්පීය ක්‍රම නිර්මාණය කිරීම අරමුණු කරගත් පර්යේෂණ කටයුතු සඳහා මූල්‍යමය සහ ද්‍රව්‍යමය ආධාර සැපයීමට නව වැඩ පිළිවෙලක් සකස් කරනු ඇත.

## අපේ ආර්ථික ප්‍රතිපත්තියේ අනිකුත් ලක්ෂණ

1. පුද්ගලික අංශයේ සංවර්ධන කටයුතු උනන්දු කිරීම සඳහා, එම අංශයේ දැනට ඇති බදු බර ලිහිල් කරනු ඇත. උපයන විට ගෙවීමේ බදු ක්‍රමය අහෝසි කෙරේ.

2. කිරි, සත්ව පාලන හා සත්ව නිෂ්පාදන සහ ධීවර කර්මාන්ත අංශවල නිෂ්පාදනය දියුණු කිරීමට අවශ්‍ය දිරි ගැන්වීම් සපයන්නෙමු. විශේෂයෙන් ම මේ අංශවල දේශීය ව්‍යාපාරිකයන්ගේ සහභාගිත්වය දිරි ගන්වමු.

3. වතු වගාව අළුතෙන් පටන් ගැනීමටත්, තිබෙන වතුවල වගාවන් අළුත් කිරීමටත් අවශ්‍ය දිරි ගැන්වීම් සැපයීම සඳහා ප්‍රමාණවත් සහ සුදුසු සහනාධාර ක්‍රමයක් ක්‍රියාත්මක කරන්නෙමු.

4. අප රටේ ප්‍රධාන අවශ්‍යතාවක් වන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම අරමුණු කොටගෙන, සාධාරණ වෙළඳ කොමිසමේ කාර්ය භාරය ශක්තිමත් කරන්නෙමු. සෑම දිස්ත්‍රික්කයක ම එහි ශාඛා පිහිටවනු ඇත. කෙසේ වුවත්, පුද්ගලික අංශයේ ව්‍යාපාරවල කටයුතු අනවශ්‍ය ලෙස පාලනය කිරීම සිදු නොවීමට ද වග බලා ගැනෙනු ඇත.

5. යටිතල පහසුකම් (මාර්ග, විදුලි සංදේශ, වාරිමාර්ග, ජලය ආදිය) සංවර්ධනය සඳහාත්, සමහර ක්ෂේත්‍රවල පුද්ගලික අංශයේ සහභාගීත්වය උපරිම කිරීම සඳහාත් දුෂ්කර රාජ්‍ය පරිපාලන රෙගුලාසි හා ලේඛනගත කිරීම් වලින් තොර ස්වාධීන යටිතල පහසුකම් සංවර්ධන අධිකාරියක් ස්ථාපනය කරනු ඇත.

6. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා විද්‍යාව හා තාක්ෂණය ඉතාම වැදගත් අංශ ලෙස පිළිගන්නා අපි, අප රටේ සියළු සංවර්ධන යෝජනා ක්‍රමයන්හි මෙහෙයුම් කටයුතුවල ප්‍රමුඛතාවය හැකිතාක් දුරට දේශීය විද්‍යාඥයන්ට හා තාක්ෂණික ප්‍රවීනයන්ට ලබා දෙනු ඇත.

7. සංවර්ධනය හා සංරක්ෂණය සමගාමීව ක්‍රියාත්මක කිරීම තුළින් තිරසාර ආර්ථිකයක් ගොඩ නැගීම අපේ නිදහස් ආර්ථික සංකල්පයේ මූලික අරමුණක් වන අතර, එකී අරමුණ සාක්ෂාත් කර ගැනීම උදෙසා ආර්ථික වශයෙන් ශක්‍යතාවයක් ඇති, සමාජීය වශයෙන් හිතකර හා පාරිසරික වශයෙන් අනුකූල වන්නා වූ ලෙසින් සෑම සංවර්ධන වැඩ සටහනකටම මග පෙන්වන්නා වූ සැළසුම් ඇති කරනු ඇත.

8. ශ්‍රී ලංකාව කලාපීය මූල්‍ය සේවා සැපයීමේ මධ්‍යස්ථානයක් ලෙස උපරිම වශයෙන් දියුණු කරනු ඇත.

9. වරාය හා ගුවන් තොටුපළවල් වල කාර්යක්ෂමතාවය විධිමත් ලෙස දියුණු කරමින්, අප රට අන්තර් වෙළඳාම් කටයුතු මධ්‍යස්ථානයක් ලෙස වර්ධනය කර, ඒ තුළින් ලංකාව දකුණු ආසියාවට ද්වාරයක් ලෙස දියුණු කර, විශාල ප්‍රතිලාභ ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

10. පෙට්‍රල් සහ ඩීසල් මිළ අඩු කරනු ඇත. මේ තුළින් අත්‍යාවශ්‍ය ආහාර හා අනිකුත් භාණ්ඩවල මිළ අඩු කරනු ඇත.

11. **ජාතික සංවර්ධන සභා ක්‍රමයක්**
පෞද්ගලික අංශයේ විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින්, විද්වතුන්, රජය හා සේවක නියෝජනත්වයක් ද සහිතව ජාතික සංවර්ධන සභා ක්‍රමයක් ආරම්භ කරමු. මෙහිදී නව කාර්මික රටවල් බවට පත් වූ නැගෙනහිර ආසියාතු රටවල ආකෘතිය උචිත පරිදි යොද ගැනේ. කෘෂිකර්ම, කර්මාන්ත හා සේවා අංශයන්ට වෙන් වෙන්ව මෙම සභා ඇති කරන අතර, ඒ සියල්ල එක්කර ජාතික සංවර්ධන සභා පිහිටවනු ඇත. මෙම සභා ක්‍රමය රජය හා පෞද්ගලික අංශය අතර ඵලදායී සංවාදයකට මඟ පාදනු ඇත. අදාල ප්‍රමුඛතා අංශ පදනම් කරගෙන දුර දැක්මක් සහිතව නව කාර්මික කරණය කරා ළඟාවීමට අවශ්‍ය පුරෝගාමී කර්මාන්ත, කර්මාන්ත සහ සේවා අංශයන්හි ප්‍රගුණ කළ යුතු ක්ෂේත්‍රයන් කල් තියා හඳුනා ගැනීමට මෙම ජාතික සංවර්ධන සභා ක්‍රමය උපකාරී වනු ඇත.

12. සෑම ගමකටම ජලය, විදුලිය, මාර්ග, තැපැල් හා විදුලි සංදේශ පහසුකම් ලබා දීමේ කඩිනම්, ජාතික වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරනු ඇත.

# කෘෂිකාර්මික ප්‍රතිපත්තිය

1977 පටන් තිබුණු එ. ජා. ප. ආණ්ඩු, අප රටේ කෘෂිකාර්මික ශක්‍යතාවයන් වර්ධනය කිරීමට අසමත් වීම දැන් ඉතා ප්‍රත්‍යක්ෂව පෙනේ. පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවීන් 17 දෙනෙකු මෑත දී සියදිවි නසා ගැනීමෙන් ඉතා ඛේදජනක ලෙස ප්‍රකාශයට පත් වී තිබෙන්නේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ අර්බුදය කෙතරම් තියුණු වී තිබේ ද? යන්නයි. අපේ මැතිවරණ ප්‍රකාශනයේ අන් තැනෙක සඳහන් කර ඇති පරිදි, මේ අර්බුදයෙන් පීඩාවට පත්ව සිටින ගොවි ජනතාවට ක්ෂණික සහන සැලසීමේ වැඩ පිළිවෙලක් වහාම දියත් කරන්නෙමු.

කෘෂිකාර්මික සංවර්ධනය ඉලක්ක කර ගත් ඵලදායී ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවයට, පොදුජන එක්සත් පෙරමුණ මහත් ප්‍රමුඛතාවයක් දෙයි. කෘෂි නිෂ්පාදනය, වතු වැවිලි අංශය, ධීවර කර්මාන්තය, සත්ත්ව පාලනය යන ක්ෂේත්‍රයන්හි ඒකාබද්ධ සංවර්ධනයක් ඇති කිරීමට අවශ්‍ය සැලසුමක් සකස් කර ක්‍රියාත්මක කරමු.

ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය කර්මාන්ත කරණය වෙනට මාරු වී ඇති නමුදු, කෘෂිකර්මය තවමත් අප රටේ වැදගත්ම ආර්ථික අංශය වශයෙන් පවතී. රටේ රැකියා අවකාශවලින් 50% ක් පමණක් විදේශ විනිමය ඉපැයීම් වලින් 40% ක් සහ දළ ජාතික නිෂ්පාදිතයෙන් 23% කුත්, වැවිලි කර්මාන්ත ද ඇතුළු කෘෂිකර්මයට සම්බන්ධයි. කෘෂිකර්මයත්, ස්වාභාවික සම්පත් සහ ගැමි ජනතාවත් ආරක්ෂා කර ශක්තිමත් කිරීමට අපි සෑම පියවරක් ම ගන්නෙමු. අපේ ගොවි ජනතාව, දරිද්‍රතාවයට සහ හිඟමනට නොවැටී, සමෘද්ධියට පත්වෙනු දැකීම අපේ අභිලාෂයයි.

කෘෂිකාර්මික නිෂ්පාදනයට සම්බන්ධ කටයුතුවලදී රජයට විශේෂ කාර්යභාරයක් ඇති බව පොදුජන එක්සත් පෙරමුණ පිළිගනී. පොහොර සහනාධාරය සතුටුදායක මට්ටමකින් නැවත ලබා දෙන්නෙමු. එ. ජා. ප. ය ඉදිරිපත් කරන රු. 500/- සහනාධාරය කිසියේත්ම ප්‍රමාණවත් නැති රැවටිල්ලකි. අපේ ප්‍රතිපත්තිවලට අනුව කෘෂිකාර්මික උපකරණ බද්දෙන් නිදහස් කෙරෙන අතර, අවශ්‍ය සියළු තැනකදීම සහනාධාර දෙනු ඇත. මේ අනුව කෘෂි උපකරණ සහ යෙදවුම්වල මිළ විශාල වශයෙන් අඩු කෙරෙනු ඇත. වී, මිරිස් ධාන්‍ය යනාදී කෘෂිකාර්මික නිෂ්පාදනවලට අවම මිලක් සහතික කරනු පිණිස පුද්ගලික අංශයේද සහයෝගය ඇතිව මනා විකිණීමේ ක්‍රමයක් සකස් කරන්නෙමු.

සෑම අවස්ථාවකදීම, සාධාරණ මිල ගණන්වලට ආහාර ද්‍රව්‍ය වෙළඳ පොලෙන් ලබා ගැනීමට හැකි තත්වයක් ඇති කරන්නෙමු. එමෙන්ම, වෙළඳපොලේ කෘෂි නිෂ්පාදන සැපයුම ඉහළ යන්නේ නම්, අස්වනු නෙළන අවස්ථාවල දී ගොවීන් ආරක්ෂා කිරීමට පියවර ගැනේ.

සුළු නිෂ්පාදකයාගේ ණය අවශ්‍යතා එ. ජා. ප. ආණ්ඩුවලින් සම්පූර්ණයෙන්ම නොසලකා හැර ඇත. දැනට ණය සපයන ආයතන වන වාණිජ බැංකු, රාජ්‍ය බැංකු, ග්‍රාමීය බැංකු, සහ රාජ්‍ය නොවන සංවිධාන වලින් සැපයෙන ණය පහසුකම් කිසිසේත්ම ප්‍රමාණවත් නැත. මේ පිළිබඳව නිර්භය ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැගීමේ අවශ්‍යතාවය පොදුජන එක්සත් පෙරමුණ පිළිගනී. ග්‍රාමීය මූල්‍ය ආයතනයක් පිහිටුවීම මගින් කෘෂිකාර්මික ණය සැපයීම විධිමත් සහ පහසු කරනු ඇත. කෘෂි රසායනික ද්‍රව්‍ය සහ කෘෂි උපකරණ මිල දී ගැනීමට, අඩු පොලී සහිත පහසු ණය ක්‍රමයකින්, ගොවීන්ට ආධාර කරනු ඇත.

ගොවීන්ට නව විශ්‍රාම වැටුප් ක්‍රමයක් ද, වඩා හොඳ කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමයක් ද හඳුන්වා දෙන්නෙමු.

එ. ජා. ප. ආණ්ඩුව විසින් අඩපණ කරන ලද කෘෂි සේවා මධ්‍යස්ථාන සහ කෘෂි ව්‍යාප්ති සේවාවන් නැවත ඇති කරන්නෙමු.

උසස් වර්ගයේ බීජ වර්ග ලබා ගැනීමට ඇති පහසුකම් දියුණු කරන්නෙමු. එමෙන්ම කෘෂි නිෂ්පාදකයින්ට, විශේෂයෙන් ම එළවළු ගොවීන්ට, අත්‍යවශ්‍ය තිබෙන පැල තවාන්, එළවළු ගබඩා කිරීමේ මධ්‍යස්ථාන, ශීත ගබඩා සහ වෙළඳ පොල සකස් කිරීමේ මධ්‍යස්ථාන, සහ නව විකිණීමේ පහසුකම් ඇති කරන්නෙමු. මේ තුළින් කෘෂි නිෂ්පාදන සැපයුම් ඉහල යනවිට, ඒවා ගබඩා කර හෝ සැකසුම් කර තබා, මිල පහත වැටීම පාලනය කළ හැකිවේ.

ග්‍රාමීය කර්මාන්ත වලට අවශ්‍ය දිරිගැන්වීම් සහ ආධාර සපයන අතර, වෙළඳ පොලේ සාර්ථක ලෙස තරඟ කිරීමට හැකියාව ලබා ගැනීමට ඒවාට අවශ්‍ය පහසුකම් ද සපයනු ඇත. ඒවාට යෝග්‍ය තාක්ෂණය ද හඳුන්වා දෙනු ලැබේ.

කෘෂිකාර්මික පර්යේෂණ සඳහා අවශ්‍ය මූල්‍ය සහ ද්‍රව්‍යමය ආධාර සැපයීමට ප්‍රමුඛත්වය ලබාදීමට පොදුජන එක්සත් පෙරමුණ කැප වී සිටී.

### අපේ කෘෂිකර්ම ප්‍රතිපත්තියේ අනෙකුත් අංග

01. අප රටේ කෘෂිකාර්මික ඉඩම් වලින් ලබාගත හැකි ඵලදාව ඉතා අඩු මට්ටමක පවතී. මේ තත්ත්වය වෙනස් කිරීම සඳහා ජාතික කෘෂිකාර්මික නිෂ්පාදන වැඩ පිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙමු. මෙහි දී කෘෂිකාර්මික පර්යේෂණයන්ගෙන් කළ හැකි සේවය අති විශාල හෙයින් ඒ සඳහා අවශ්‍ය මූල්‍යමය හා ද්‍රව්‍යමය අනුබල ලබාදීමට විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරනු ඇත.

02. ලංකාව පුරා විසිරී ඇති දැනට ඉතා කණගාටුදායක තත්වයක පවතින කෘෂිකාර්මික හා සත්ව පාලන පර්යේෂණ හා පුහුණු ආයතනවල තත්ත්වය ඉතා කඩිනම් අවශ්‍යතාවයක් ලෙස සලකා රජයේ හා විදේශ ආධාර මත ඉතා උසස් තත්වයට ගෙන ඒමට කටයුතු කරනු ඇත.

03. ක්‍රමානුකූල කෘෂි ව්‍යාප්ති සේවයක් රටපුරා ආරම්භ කරනු ඇත.

04. ග්‍රාමීය කෘෂිකාර්මික ප්‍රදේශවල රැකියා වියුක්තිය හා ඌණ සේවා නියුක්තියට පිළියමක් වශයෙන් කෘෂිකර්මය මත පදනම් වූ කර්මාන්ත වලට ඉහල ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ.

05. වැවිලි ආර්ථිකයෙන් ලබාගත හැකි ආදයමට වඩා ලැබෙන ආදායම ඉතා පහත් මට්ටමක පවතී. එයට පිළියමක් වශයෙන් යථා යෝග්‍ය පරිදි එම වගාව හා නැවත වගාවන්ට ද අතුරු බෝග වගාවන්ට ද, ආශ්‍රිත කර්මාන්ත හා සත්ව පාලන කටයුතු වලට ද විශේෂ සහනාධාර අනුග්‍රහ හා අනුබල ලබාදෙනු ඇත.

06. වියළි කළාපයේ ගොවියාගේ තත්වය ඛේදජනක වේ. මෙම කලාපයේ උස්භූමි සංවර්ධනය නිත්‍ය භෝග වගාවෙන් හා පහත් භූ ජලය ප්‍රයෝජනයට ගෙන විවිධ භෝග වගා කිරීමෙන් සංවර්ධනය කිරීමේ ක්‍රියාදමයක් ජාත්‍යන්තර කෘෂි සංවිධාන ආයතනවල ආධාරයෙන් ක්‍රියාත්මක කෙරේ.

07. කෘෂිකාර්මික සත්ව පාලන හා ධීවර අංශයන්ට මැදි හා දිගු කාලීන සහන ණය පහසුකම් ලබාදීම අරමුණ කරගත් කෘෂිකර්මාන්ත හා ධීවර බැංකුවක් ප්‍රමාණවත් ශාඛා සහිතව ආරම්භ කරනු ඇත. එහි ප්‍රාග්ධනය රජය, මහබැංකුව හා මහජනතාවගේ සහභාගිත්වයෙන් සම්පාදනය කරනු ලැබේ.

08. අස්වනු කාලයට නිෂ්පාදිතය අපතේ යාම හා නාස්තිවීම් වැලැක්වීම සඳහා හොඳ මිලක් ලබාදීම සඳහා අදාළ නිෂ්පාදන ප්‍රදේශයෙන් රැස්කර ගැනීමටත්, කල්තබා ගැනීමටත් ක්‍රමානුකූලව වෙළඳ පොලට ඉදිරිපත් කිරීමටත් විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන අතර, ඒ සඳහා රජයේ හා පෞද්ගලික අංශයේ සහභාගිත්වය ද බලාපොරොත්තු වේ.

09. පොල් සහ තල් වගාව දියුණු කිරීම සඳහාත් ක්‍රමවත් කිරීම සඳහාත් අස්වනු වැඩි කර ගැනීම සඳහාත් ඒ ආශ්‍රිත සුළු කර්මාන්ත දිරි ගැන්වීම සඳහාත් විශේෂ ජාතික වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කෙරේ.

10. කිතුල් වගාව ආශ්‍රිත කිතුල් පැණි, හකුරු හා මී කර්මාන්තය දියුණු කිරීම සඳහාත් රජයේ විශේෂ අනුග්‍රහය ලැබෙනු ඇත.

## පශුපාලන සහනාධාර

01. සත්ව ආහාර හා උසස් වර්ගයේ සතුන් සහනාධාර පදනමක් යටතේ ලබාදීමේ විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරනු ඇත.

02. සත්ව පාලන කටයුතු සඳහා සහනදායි දිගුකාලීන ණය ලබාදීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කෙරේ.

03. සත්ව පාලන කර්මාන්ත ආශ්‍රිත අතුරු නිෂ්පාදන කර්මාන්ත දිරිගැන්වීම සඳහා විශේෂ ආධාර වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කෙරේ.

# කර්මාන්ත ප්‍රතිපත්තිය

පොදුජන එක්සත් පෙරමුණේ කර්මාන්ත ප්‍රතිපත්තිය, එ.ජා.ප. රජයේ ප්‍රතිපත්තිය වැනි අක්‍රිය එකක් නොවනු ඇත. අපේ ප්‍රතිපත්තිය පදනම් වනු ඇත්තේ, ශක්තිමත් සහ තිරසාර ආර්ථික සංවර්ධනයක් සඳහා අවශ්‍ය දේශීය නිෂ්පාදන පදනමක් ගොඩ නැගීමයි.

මෙහෙයවීම සහ පාලනය කිරීම අවම මට්ටමක පවත්නා, ආර්ථික සහ මූල්‍ය දිරිගැන්වීම් සහිත, පැහැදිලි ප්‍රතිපත්තිමය ස්ථාවරයකින් සමන්විත සහ හිතවතුන්ට අනිසි වාසි නොසපයන, කාර්මික වර්ධනයට හිත කර වන්නා වූ ආරම්භකමය වාතාවරණයක් සපයන ගමන් ම, රටට දිර්ඝ කාලීන වශයෙන් වාසි ගෙන දෙන නව කර්මාන්ත ඇති කිරීමට තුඩුදෙන ප්‍රතිපත්ති මාලාවක් අපි හඳුන්වා දෙමු.

දේශීය අමුද්‍රව්‍ය මත පදනම් වන කර්මාන්ත හඳුනාගෙන, ඒවායේ වර්ධනයට අවශ්‍ය විශේෂ පහසුකම් සපයන්නෙමු. කර්මාන්තවලට අවශ්‍ය යටිතල පහසුකම්, ණය සහ වෙළඳපොල පහසුකම් එයට අයත් වේ. සුළු කර්මාන්ත වර්ධනයට අත දෙන කාර්මික සංවර්ධන බැංකුවක් පිහිටුවන්නෙමු.

විදේශයෙන් ආනයනය කරන භාණ්ඩ සමඟ ඇති තරඟයෙන් දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා, පරණ විදේශ බඩු මහා පරිමාණයෙන් ගෙන්වීම නිසා සහ අසාධාරණ වෙළඳ ප්‍රතිපත්ති නිසා හානි සිදු වී ඇත්දැයි සම්පූර්ණ පරීක්ෂණයක් කෙරෙනු ඇත. විශිෂ්ටත්වයට සහ ජාත්‍යන්තර වශයෙන් තරඟකාරී මට්ටමකට පත් වී ඇති දේශීය කර්මාන්ත හඳුනාගෙන, ඒවායේ අපනයන හැකියාව දියුණු කිරීමට අවශ්‍ය සියලු සහාය ලබා දෙනු ඇත.

නූතන අධි තාක්ෂණ කර්මාන්ත සහ මහා පරිමාණ කර්මාන්තවලට සම්බන්ධ අධි තාක්ෂණික සහාය කර්මාන්ත තෝරා ගෙන, ඒවා ලංකාවේ ආරම්භ කිරීමට විදේශ ආයෝජකයින් උනන්දු කරවන්නෙමු.

ළඟදීම ඇති විය හැකි බලශක්ති අර්බුදය වැළැක්විය හැකි වන පරිදි, විවිධාංගකරණ ක්‍රමයක් යටතේ රටේ බලශක්ති නිෂ්පාදන ධාරිතාව ශීඝ්‍ර ලෙස වර්ධනය කරන්නෙමු. රාජ්‍ය අංශයේ බලශක්ති නිෂ්පාදනය දියුණු කරන අතරම, බලශක්ති වර්ධනය සඳහා විදේශ සැපයීම් සහ පුද්ගලික ආයෝජනවල හැකියාව සොයා බලන්නෙමු.

දකුණු ආසියාතික (සාර්ක් කලාපයේ) රටවල් සමඟ කර්මාන්ත සහයෝගිතා ප්‍රතිපත්තියක් සකස් කිරීමේ හැකියාව අපි පරීක්ෂා කරන්නෙමු. එවැනි ප්‍රතිපත්තියක් මගින් අපේ කර්මාන්ත සාර්ක් රටවල කර්මාන්ත සමඟ බද්ධ කිරීමටත්, එම රටවල වෙළඳ පොළවල් වල අපේ භාණ්ඩවලට ඇති අවකාශ අනුව අපේ කර්මාන්ත ප්‍රතිපත්තිය සැලසුම් කිරීමටත් එමගින් හැකියාව ලැබෙනු ඇත. දකුණු ආසියාතික රටවලින් යාන්ත්‍රික උපකරණ ලබා ගත හැකි කර්මාන්ත ද අපි පිහිටුවන්නෙමු.

අතිශයින් ම නිලධාරිවාදීකරණයට ලක් වී ඇති අපනයන සංවර්ධන මණ්ඩලය වැනි ආයතන ප්‍රතිශෝධනය කරන්නෙමු. කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ අපනයන කර්මාන්ත, අපනයන සංවර්ධන මණ්ඩලයේ විශේෂ සැලකිල්ලට යොමු වනු ඇත.

වතු වැවිලි සහ කෘෂිකාර්මික අංශවල අපනයන උනන්දු කිරීමට විශේෂ අවධානයක් යොමු කරන්නෙමු. දැව භාණ්ඩ, කජු, දුම්කොළ, පැළෑටි, මනිකර ද්‍රව්‍ය, පිගන් භාණ්ඩ, කොහු, බෙහෙත් පැළෑටි සහ කෘතිම ආභරණ අපනයනය කිරීම දිරිගැන්වීමට විශේෂ ප්‍රයත්නයක් දරන්නෙමු.

මැණික් කර්මාන්තයත්, ගොඩනැගිලි නිර්මාණ කර්මාන්තයත් පණ ගන්වා දියුණු කිරීමට අවශ්‍ය සෑම පියවරක් ම ගන්නෙමු. මේ ක්ෂේත්‍රයන්ට අදාළ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කරන්නෙමු.

නාවික කර්මාන්ත දේශීය ව්‍යාපාරිකයින් සහභාගි වීම, සුදුසු දිරිගැන්වීම් මගින් ආධාර දී ශක්තිමත් කරන්නෙමු.

## අපේ කර්මාන්ත ප්‍රතිපත්තියේ මූලික ලක්ෂණ

01. නන්නත්තාර වී ඇති අපේ කර්මාන්ත ක්ෂේත්‍රය පැහැදිලි හා දූරදක්නා සැලැස්මක් මත සංවර්ධනය කරනු ඇත.
02. අපේ කර්මාන්ත ප්‍රතිපත්තිය තුළ ප්‍රමුඛතාවය ලැබිය යුතු අංග මුලින්ම හඳුනාගෙන ඒ අනුව අදාළ ප්‍රතිපත්ති සකස් කර සංවර්ධන ක්‍රියා මාර්ගය දියත් කරනු ඇත.
03. දේශීය ස්වාභාවික සම්පත් හා මිනිස් සම්පත් ඒකාබද්ධ කර වහා දියුණු කළ හැකි කර්මාන්ත, ජනතාවගේ මූලික අවශ්‍යතාවයන් දේශීය නිෂ්පාදන වලින් සපුරාලීමේ අරමුණින් ආරම්භ කරන කර්මාන්ත, විදෙශ වෙළඳ පොලේ පහසුවෙන් අලෙවි කළ හැකි ද්‍රව්‍ය නිෂ්පාදනය කරන කර්මාන්ත, මහා පරිමාන කර්මාන්ත කරුවන්ට අවශ්‍ය අතුරු නිෂ්පාදන කර්මාන්ත, කෘෂි නිෂ්පාදන සැකසුම් කර්මාන්ත, සත්ව පාලන හා ධීවර කර්මාන්ත ආශ්‍රිත කර්මාන්ත අපේ ප්‍රමුඛතා ලේඛණයෙහි ඉහල මට්ටමක් ගනී.
04. දිගුකාලීන ඵලදායී හා තරඟකාරී තත්ත්වයන්ට පත්විය හැකි ළදරු කර්මාන්ත වලට ආරක්ෂණය දිරිගැන්වීම හා මඟ පෙන්වීම් මගින් ශක්තිමත් දේශීය කාර්මික අංශයක් වැඩිදියුණු කිරීමට කටයුතු කරනු ඇත.
05. ශ්‍රී ලංකාවේ දීර්ඝකාලීන හා තිරසාර කාර්මික සංවර්ධනය සඳහා හොඳින් ඒකාබද්ධ වූ ආයතනික ව්‍යුහයන් ගොඩනැංවීම අපේ ප්‍රධාන අපේක්ෂාවකි. ඒ සඳහා ජාත්‍යන්තර වෙළඳාම හා කාර්මිකකරණය රාජ්‍ය කටයුතුවලදී ඒකාබද්ධව කටයුතු කරන වැඩ පිළිවෙලක් සකස් කෙරේ.
06. සුළු කර්මාන්ත අංශයන්හි පවත්නා විවිධාකාර වූ ප්‍රශ්න සුළු කර්මාන්ත සංවර්ධනය අඩාල කර දමා ඇත. මෙම ක්ෂේත්‍රයේ පවත්නා විවිධ ප්‍රශ්න ඒකාබද්ධ ස්වරූපයකින් විසඳාලීම අරමුණු කොට ගෙන දැනට පවත්නා විවිධ රාජ්‍ය ආයතන ඒකාබද්ධ කොට ප්‍රාදේශීය ශාඛාවලින් යුක්ත, එකම ස්ථානයකින් සියලු ප්‍රශ්ණ විසඳාගත හැකි මධ්‍යම හා සුළු පරිමාන කර්මාන්ත සංවර්ධන ආයතනයක් බිහි කරනු ඇත.
07. සුළු හා මධ්‍යම පරිමාන කර්මාන්ත දියුණුව වේගවත් කිරීම සඳහා යෝජිත සමෘද්ධි වැඩ සටහන ප්‍රමුඛතාවයක් ගනු ඇත.
08. නිදහස් ආර්ථිකයට අවශ්‍ය වන පරිදි නිපුණතා ප්‍රගුණ කිරීම සඳහා නිපුණතා සංවර්ධන අරමුදලක් ඇති කරනු ඇත. මෙහිදී නිර්යාත වර්ධනය කරන ක්ෂේත්‍රයන්ට ප්‍රමුඛතාවය සලසනු ඇත. මෙම නිපුණතා සංවර්ධන ක්‍රියාවලිය වර්තමානයේ පවත්නා ඇඟළුම් අපනයනය වැනි ප්‍රාථමික කාර්මික මට්ටමකට සිට වඩා සියුම් හා ඉහළ තාක්ෂණයෙන් යුතු කාර්මික නිෂ්පාදන මට්ටමක් කරා අප රටේ කර්මාන්ත ඉහළ නැංවීමට උදව් වනු ඇත. මෙමගින් ලුහු කර්මාන්ත මෙන් ම වඩාත් ඉහළ ශිල්පීය නිපුණතාවයකින් යුතු කාර්මික භාණ්ඩ නිෂ්පාදනය කිරීමට ද නිර්යාත භාණ්ඩ නිෂ්පාදනය කිරීමට ද අවස්ථාව සැලැසේ.

# ඉඩම්

01. ඉඩම් අප රටේ සීමිත සම්පතක් වන බැවින්, ජනගහනයේ වැඩි වන අවශ්‍යතා සහ ජාතික ආර්ථික සංවර්ධනයේ අවශ්‍යතාවලට ගැලපෙන විධිමත් ඉඩම් ප්‍රතිපත්තියක් ක්‍රියාවට නගනු ඇත.

02. පසුගිය 17 අවුරුද්ද තුළ ඉතා අසාධාරණ ලෙස හා අඩු මුදලට සිය පෞද්ගලික අයිතියට පවරා ගත් රජයේ ඉඩම් ඒ අය ගෙන් නැවත රජයට පවරා ගෙන ඒවා ඉඩම් නැති ජනතාව අතර බෙදා දීමට කටයුතු කරනු ඇත.

03. අපේ වනාන්තර හා සාරවත් පස ආරක්ෂා කර ගැනීමේ ජාතික සංරක්ෂණ වැඩ පිළිවෙලක් ක්‍රියාවට නගනු ඇත.

04. අප රටේ ඉඩම් විදේශීය ගැණුම්කරුවන්ට විකිණීම සම්බන්ධ ජාතික ප්‍රතිපත්තියක් සකස් කරනු ඇත.

# ධීවර කර්මාන්තය

1. සියලු ධීවර හා ජලජ සම්පත් විද්‍යාත්මකව වර්ධනය කිරීමට විශේෂ ජාතික වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කෙරේ. එහි සියලු ඵලයන් එකී භාරධූර කර්මාන්තයේ නියැලී සිටින සියළු ධීවර කාර්මිකයන්ට හා ඔවුන්ගේ පවුල් වලටත්, පාරිභෝගික ජනතාවටත්, හිමිකර දීමට සැළසුම් කෙරේ.

2. ධීවර කාර්මිකයින්ගේ ධීවර යාත්‍රා සාගරයට ගෙන යාමටත්, යළි ගොඩ බිමට ගෙන ඒමටත්, අත්‍යවශ්‍ය වූ වරාය, තොටුපල හා නැංගුරම් පොලවල් සැලැස්මක් මත පිහිටුවනු ඇත.

3. නවීන ධීවර යාත්‍රා, එන්ජින්, දැල්, ආම්පන්න සහිතව ලබා දෙමින් කර්මාන්තයේ වර්ධනය සඳහා විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම

4. ජාතික වූ ද, ජාත්‍යන්තර වූද, සියළු ආකාරයේ මුහුදු කොල්ලකරුවන් ගෙන් ධීවර හා ජලජ සම්පතත්, ධීවර කාර්මිකයාත් රැක ගැනීමට අවශ්‍ය නීති රීති පනවනු ඇත.

5. ජාතික ධීවර විශ්වවිද්‍යාල ආයතනයක් පිහිටුවා ඒ තුළින් ධීවර කාර්මිකයන්ට නව ශිල්පීය දැනුම ලබා දී ඒ තුළින් ධීවරයන් නාවිකයින් බවට පත් කොට ධීවර කර්මාන්තය නිෂ්පාදන බලවේගයක් ලෙසත්, වෙරළ සහ සයුර රකින ආරක්ෂිත බලවේගයක් ලෙසත් පුහුණු කොට සේවයේ යෙදවීම.

6. අපේ ධීවර කර්මාන්තය තවමත් පවතින්නේ දඩයම් කර්මාන්තයක් වශයෙන් මිස ධීවර වගාවක් වශයෙන් නොවේ. ධීවර ක්ෂේත්‍රයේ ධීවරයන් කෙරෙහි පවත්නා දුප්පත්කම හා ප්‍රමාණවත් නොවන නිෂ්පාදන යන කාරණා මේ සඳහා සෘජු ලෙස බලපා ඇති අතර, ධීවර කර්මාන්තය ධීවර වගාවක් බවට පත් කරන ප්‍රතිපත්තියක් තුළ මේ කර්මාන්තය මෙරට ජාතික ආර්ථිකයේ ප්‍රබල ස්ථානයකට පත් කිරීමටත්, ඉහත සඳහන් ක්‍රියා මාර්ග තුළින් අවශ්‍ය පියවර ගනු ඇත.

7. ධීවරයින් රක්ෂණය පිණිස නවීන විධි විධාන යොදනු ඇත.

# සමුපකාරය

01. අපේ ආර්ථික ක්‍රමයේ සමුපකාර අංශයටත් ඉතා වැදගත් කාර්ය භාරයක් පැවරෙනු ඇත. නිෂ්පාදන හා සේවා තරඟකාරිත්වය ශක්තිමත් කිරීමටත් අත්‍යාවශ්‍ය සේවාවන් නොකඩවා ඉදිරියට ගෙන යාමටත්, අතර මැදියන්ගෙන් පාරිභෝගිකයාට වන පීඩන වැළැක්වීමටත් සමුපකාරය වඩාත් ශක්තිමත් ව්‍යාපාරයක් ලෙස රැකගතයුතු බව අපේ මතයයි.

02. සමුපකාර ව්‍යාපාරය නවීකරණය කර, පෞද්ගලික අවශ්‍යතා සමඟ තරඟකාරී මට්ටමකට ගෙන එමින් පාරිභෝගිකයාට උපරිම සේවාවක් සැලසෙන තත්ත්වයට එය වර්ධනය කරනු ඇත.

03. සමුපකාර ව්‍යාපාරයට නම ව්‍යාපාර කටයුතු හා ආයෝජන කටයුතු කර ගැනීමට අවශ්‍ය විශේෂ දිරිගැන්වීම හා අනුග්‍රහ ලබා දෙනු ඇත.

04. පෞද්ගලික හා පොදු සමාගම්වලට ලැබෙන සියලු බදු සහන හා පොලී සහන සමුපකාරයටත් ලබා දෙනු ඇත.

05. පිරිවැටුම් බද්දෙන් හා මුද්දර බද්දෙන් සමුපකාරය නිදහස් කෙරේ.

06. රජයෙන් සමුපකාරයට අයවිය යුතු මුදල් ප්‍රමාදයකින් තොරව ගෙවීමට විධිවිධාන යොදන අතර හදිස්සියේ සිදුවන ප්‍රමාදයන් සඳහා බැංකු අයිරා පොලියට සමාන පොලියක් ගෙවීමට කටයුතු කෙරේ.

07. සමුපකාරිකයාට සමුපකාර බැංකුවක් සහ රක්ෂණ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ඉඩකඩ ලබා දෙනු ඇත.

08. සත්ව පාලන කටයුතුවලට සම්බන්ධ හා නිෂ්පාදන කටයුතුවලට සම්බන්ධ සමුපකාරවලට බාධාවන්ගෙන් තොරව සිය ව්‍යාපාර කටයුතු දියුණු කර ගැනීමටත්, නව නිෂ්පාදන හා ව්‍යාපාර කටයුතු වලට අවතීර්ණ වීමටත් සියලු අවකාශ සලසනු ඇත.

09. සමුපකාර ආයතන ගණනාවක් සාමූහිකව එක්වී මහා පරිමාණ නිෂ්පාදන හා ව්‍යාපාර කටයුතුවලට අවතීර්ණ වීමට අවශ්‍ය පහසුකම් සැලසේ.

10. සමුපකාර ව්‍යාපාරය ලාබ ලබන ව්‍යාපාරයක් බවට පත් කර සේවකයන්ගේ ගෞරවයත්, සේවා ස්ථිරත්වයත්, හොඳ නව වැටුප් ක්‍රමයකුත් හඳුන්වා දීමට කටයුතු කරනු ඇත.

11. සමුපකාර සේවකයාට සමුපකාරය තුළින් ම විශේෂ නිවාස යෝජනා ක්‍රමයක් ක්‍රියාවට නංවනු ඇත.

12. සමුපකාර ව්‍යාපාරය රාජ්‍ය ග්‍රහණයෙන් මුදවා ස්වාධීනව වර්ධනය වීමට අවශ්‍ය නීතිමය විධිවිධාන සකසනු ලැබේ.

# සහනාධාර

**ආත්ම ගෞරවයෙන් යුතුව ජීවත්වීමට හා සිය නිෂ්පාදන හා ආදායම් වැඩි කර ගැනීමට අපෙන් ජනතාවට දෙන සහනාධාර**

1. රුපියල් 2,000/- ට අඩු මාසික ආදායම් ලබන සියළුම පවුල් වලට සිය ආදායම අනුව මසකට රුපියල් දෙදහසක උපරිමයකට යටත්ව විශේෂ දීමනාවක් ලබා දෙන්නෙමු. වයස අවුරුදු 18 ඉක්මවූ අධ්‍යාපනය අවසන් කළ අයට රැකියාවක් ලැබෙන තෙක් මසකට රුපියල් 1,500/- ක දීමනාවක් දෙනු ලැබේ.
2. ජනසවි ලාභීන් වෙනුවෙන් තැන්පත් කර ඇතැයි රජය කියන රු.25,000/- ක මුදල අදාල ප්‍රතිලාභීන්ට වහාම ගෙවා දැමීමට නියෝග කෙරේ.
3. ආබාධිත, අංග විකල අනාථ හා මානසික රෝගීන්ට පූර්ණ සමාජ රක්ෂණ ක්‍රමයක් සහතික කරනු ඇත. ඒ යටතේ ඔවුන්ගේ වගකීම රජය භාරගනු ලැබේ.

## ගොවි සහනාධාර

1. පොහොර සහනාධාරය නැවත ලබා දෙන්නෙමු.
2. බීජ, රසායන ද්‍රව්‍ය, බෙහෙත් හා ගොවි උපකරණ වලින් බදු බර හා අධික ලාභ ඉවත් කර, ඒවා විශේෂ සහනාධාර මිලකට සපයනු ඇත.
3. කල් පසුවූ වගා ණය වහාම අහෝසි කෙරේ.
4. ජල බද්ද ඉවත් කෙරේ.
5. එළවළු නිෂ්පාදන වලට මිල හා වෙළඳපොල ආරක්ෂා කිරීමේ විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කෙරෙනු ඇත.
6. සහතික මිලට වී සහ අතිරේක භෝග සුළු භෝග රජය විසින් මිළ දී ගනු ඇත.
7. ඵලදායි හා විධිමත් කෘෂි ව්‍යාප්ති සේවා වැඩ පිළිවෙලක් රට පුරා ආරම්භ කෙරේ.
8. වගා පාළුවලට ප්‍රමාදයකින් හා අපහසුතාවලින් තොරව රක්ෂණ වන්දි ගෙවනු ලැබේ. එහිදී පසුගිය කන්න ආදායමට සාපේක්ෂ වන්දියක් ගෙවනු ඇත.
9. පොලී රහිත හා අඩු පොලී කෘෂිකාර්මික ණය සහන ක්‍රමයක් කඩිනමින් ක්‍රියාත්මක කරනු ඇත.
10. දිප ව්‍යාප්ත පස සංරක්ෂණ වැඩ පිළිවෙලක් සඳහා විශේෂ සහනාධාර ක්‍රමයක් රජයේ හා පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන් ක්‍රියාත්මක කෙරේ.
11. සිගරට් හා බීඩි දුම්කොළ, උක්, ගර්කින් වැනි මුදල් භෝග සඳහා ගොවීන්ට උපරිම මිළක් ලබාදීමේ විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

## සුළු කර්මාන්ත සහනාධාර

1. සුළු කර්මාන්ත හිමියන්ට අවශ්‍ය උපකරණ හා අමුද්‍රව්‍ය විශේෂ සහනාධාර මිළකට සැපයේ.
2. ඔවුන්ගේ නිෂ්පාදන කටයුතු දියුණු කිරීමේ ඉලක්කයක් ඇතිව අති විශේෂ බදු සහන ලබා දේ.
3. ඔවුන්ගේ කර්මාන්ත දියුණු කිරීම සඳහා විශේෂ කෙටිකාලීන හා දිගු කාලීන ණය සහන ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.
4. සුළු කර්මාන්ත ව්‍යාපෘතිය හා උපදේශක සේවා ක්‍රමයක් රටපුරා ක්‍රියාත්මක කෙරේ.
5. ඔවුන්ගේ නිෂ්පාදන දේශීය හා විදේශීය වෙළඳ පොළ තුළ තරඟකාරී මට්ටමින් අලෙවි කර ගැනීමේ පහසුකම් සැපයීමටත්, එම භාණ්ඩයන්හි තත්ත්ව පාලන කටයුතු පහසු කර ගැනීමටත්, විශේෂ රාජ්‍ය අනුග්‍රහය ලබාදෙනු ඇත.
6. දේශීය කර්මාන්තකරුවන් ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය විධිවිධාන හා සහනාධාර නොඅඩුව සැපයෙනු ඇත.
7. පෞද්ගලික අංශයට අත්‍යාවශ්‍ය හා දියුණු කළ යුතු සුළු කර්මාන්ත නිෂ්පාදන හා මහා පරිමාණ කර්මාන්තයන්ට අවශ්‍ය වන අතුරු නිෂ්පාදන අලෙවි පහසුකම් ලබාදීමේ හා එම නිෂ්පාදන සඳහා දිරි දීමනා දීමේ විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වේ.

## ධීවර සහනාධාර සහ ප්‍රතිපත්ති

01. නව තාක්ෂණාංගෝපාංග රැගත් යාත්‍රා, එන්ජින්, දැල්, ආම්පන්න හා ඉන්ධන විශේෂ සහනාධාර මිලකට ලබාදීමට කටයුතු කරනු ඇත.
02. ධීවර ජනතාවට ඉතා අඩු ආදායම් ලැබෙන කාලවල ඔවුන්ගේ නඩත්තුව වෙනුවෙන් විශේෂ සහනාධාර ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ඇත.

03. අපනයන කටයුතුවලට යොමු වීමට සූදානම් වන ධීවර ජනතාවට ඒ සඳහා අවශ්‍ය මූලධන පහසුකම් දිගුකාලීන පදනමක් මත විශේෂ සහනදායි ක්‍රම තුළින් ලබාදීමට කටයුතු කරනු ඇත.

04. ධීවර කර්මාන්තය ආශ්‍රිත අතුරු කර්මාන්ත ආරම්භ කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා විශේෂ ණය පහසුකම්, බදු පහසුකම්, ව්‍යාප්ති සේවා ලබාදීමේ විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරනු ඇත.

05. මිරිදිය මත්ස්‍ය කර්මාන්තය හා සුරතල් මත්ස්‍ය කර්මාන්ත දියුණු කිරීම සඳහා දේශීය හා විදේශීය ආයෝජන දිරි ගැන්වීමේ හා ව්‍යාප්ති සේවා ලබාදීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කෙරේ.

# දරිද්‍රතාවය පිටු දැකීමේ ජාතික වැඩ පිළිවෙල

1. දරිද්‍රතාවයෙන් පෙළෙන අපේ ජනතාව ඉන් මුදවා ගැනීමේ ජාතික වැඩ පිළිවෙල අපි "සමෘද්ධි ව්‍යාපාරය" නමින් හඳුන්වමු.

2 "සමෘද්ධි" ව්‍යාපාරයේ පළමුවන කොටස අප විසින් හඳුන්වා දෙන නව සහනාධාර වැඩ පිළිවෙලයි. එහි දෙවන කොටස අඩු ආදායම් ලබන පවුල්වල ආදායම වැඩි කිරීම සඳහා ගෙනයන ආර්ථික සංවර්ධන ක්‍රියාවලියයි.

## සමෘද්ධි ව්‍යාපාරය

1. සමෘද්ධි ව්‍යාපාරය තුළින් අඩු ආදායම් ලබන සෑම පවුලක් වෙනුවෙන් ම වෙන් වෙන්ව ආර්ථික සංවර්ධන ව්‍යාපෘතියක් සැකසේ.

2. මේ පවුල් සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධීකරණය පිණිස ග්‍රාමීය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් ද ඒ සියල්ල එක් වූ ජාතික සමෘද්ධි ව්‍යාපෘති වැඩ සටහනක් ද ගොඩ නැගේ.

## සමෘද්ධි මධ්‍යස්ථාන

1. සමෘද්ධි ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම සඳහා සෑම ග්‍රාම සේවක කොට්ඨාශයකටම සමෘද්ධි මධ්‍යස්ථානයක් ඇති කෙරේ.

.2. පවුල් සංවර්ධන ව්‍යාපෘති හා ග්‍රාම සංවර්ධන වැඩ පිළිවෙල සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීමේ මධ්‍යස්ථානය මෙය වේ.

3. මෙම සෑම මධ්‍යස්ථානයකටම ගමේ උගත් කාර්යශූර තරුණ තරුණියන් ගෙන් තෝරාගත් ව්‍යාපෘති නිලධාරියකු හා සංවර්ධන නිලධාරියෙකු සේවයේ යොදවනු ඇත.

4. අදාල සංවර්ධන ව්‍යාපෘති සැකසීම සඳහාත්, ඒවා රාජ්‍ය හා අතිකුත් ආයතන සමඟ සම්බන්ධ කිරීම සඳහාත් මෙම ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහාත් ඒ ඒ පවුල් උනන්දු කිරීම සඳහාත් අදාල නිලධාරීන්ට කෙටිකාලීන හා සූක්ෂම පුහුණුවක් ලබා දෙනු ඇත.

5.. පවුල් සංවර්ධන ව්‍යාපෘතියක් නිරීක්ෂණය කිරීමේ දී අවධානය යොමු වන්නේ අදාල පවුල සතු, සම්පත් ශක්තීන් හා හැකියාවන් මත ඔවුන්ගේ පවුලේ ආදායම වැය කිරීම සඳහා කුමන ආර්ථික කටයුත්තකට යොමු කරනවාද යන්නයි. එය පෞද්ගලික අංශයේ සංවිධිත ආයතනයක රැකියාවක් හෝ ස්වයං රැකියාවක් විය හැකිය. එසේ නැත්නම් ස්වයං ව්‍යාපාරයක් වීමට ද හැකිය. මීටත් අමතරව සාමූහික නිෂ්පාදන හෝ ව්‍යාපාර කටයුත්තක් වීමට ද පුළුවන. රජයේ රැකියාවකට යොමු කිරීම ද මෙහි තවත් අංශයකි.

6. කෙසේ නමුත් ගමේ ඉදිවෙන 'සමෘද්ධි' මධ්‍යස්ථාන සෑම පවුලකම දියුණුව වෙනුවෙන් වෙන් වෙන්ව විශේෂ අවධානය යොමු කර සංවර්ධන ක්‍රියාදාමය ඉදිරියට මෙහෙයවනු ඇත.
7. අදාළ ව්‍යාපෘතින්ට අවශ්‍ය දැනුම, පුහුණුවීම්, මූලධනය, උපදේශක සේවා යනාදිය ස්වදේශීය මධ්‍යස්ථාන විසින් අදාල ආයතන හා පුද්ගලයන්ගේ සහයෝගය ඇතිව සංවිධානය කරනු ඇත.
8. මෙම සමෘද්ධි මධ්‍යස්ථානය තුළ අදාළ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සේවාවන්, බැංකු, ව්‍යාප්ති සේවා මධ්‍යස්ථාන, රාජ්‍ය ආයතන සහ වෙනත් මූල්‍ය හා තාක්ෂණික ආයතන හා පෞද්ගලික ව්‍යාපාර හා ව්‍යාපාරිකයන් මගින් ජංගම සේවා ක්‍රමයට සැපයෙනු ඇත.
9. මෙම ව්‍යාපෘතින් සාර්ථක කර ගැනීම සඳහා රජයේ දායකත්වයට අමතරව ප්‍රදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු, සමූපකාර ග්‍රාමීය බැංකු, සණස, රාජ්‍ය නොවන ආයතන හා පෞද්ගලික අංශය සංවිධානාත්මක ලෙස සහභාගි කරවා ගනු ඇත. මේ සඳහා විදේශීය රටවලින්ද ජාත්‍යන්තර මූල්‍ය ආයතන වලින්ද රාජ්‍ය නොවන ජාත්‍යන්තර සේවා සහ සංවර්ධන ආයතන වලින්ද ආධාර උපකාර ලබාගැනීමට බලාපොරොත්තු වේ.
10. මෙම පවුල් ව්‍යාපෘති වලට අවශ්‍ය මුදල් වලින් කොටසක් අප විසින් ආරම්භ කරන සමෘද්ධි බැංකුව මගින් ද ලබාදීමට බලාපොරොත්තු වේ. මෙම බැංකුව මෙවැනි සංවර්ධන ව්‍යාපාරවලට ආධාර කරන වෙනත් රටවල ඇති ග්‍රාමීය බැංකුවල සාර්ථක අත්දැකීම් ද ප්‍රයෝජනයට ගනිමින් ආරම්භ කෙරේ.
11. සමෘද්ධි මධ්‍යස්ථානයේ කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා අදාල බල ප්‍රදේශයේ පූජ්‍ය පක්ෂය ඇතුළු දැන උගත් අයගෙන් සැදුම් ලත් උපදේශක මණ්ඩලයක් පිහිටුවනු ඇත.
12. පවුල් සංවර්ධන ක්‍රියාදාමයේ ප්‍රගතිය අධීක්ෂණය කරනු සඳහා ජනතා සහභාගිත්වය ඇති ආයතන පිහිටුවනු ලැබේ.
13. මෙම වැඩ පිළිවෙළේ සියලු කටයුතු දේශපාලනයෙන් තොරව, උත්සව හා නාස්තිකාර කටයුතු වලින් තොරව, හුදෙක් ඉලක්ක අරමුණු ඉටුකිරීම සඳහා කැපවීමෙන් දායකත්වය දෙන වැඩපිළිවෙළක් ලෙස ක්‍රියාත්මක වේ.
14. මෙම කටයුතු ප්‍රාදේශිය මට්ටමෙන්, දිසා මට්ටමෙන් හා ජාතික මට්ටමෙන් සම්බන්ධීකරණය කරන අධීක්ෂණය කරන නිලධාරිවාදි නොවන ආයතන පද්ධතියක් යටතේ සංවිධානය කොට විශේෂ අමාත්‍යාංශයක වගකීමට යටත් කරනු ඇත.

## රැකියා සැපයීම

1. වසර දෙකක් තුළ දශ ලක්ෂයකට රැකියා සැපයීමේ වැඩ පිළිවෙළක් අපේ රජය විසින් ක්‍රියාත්මක කරනු ඇත.
2. මෙයට අමතරව පළමු වසර ඇතුළත ලක්ෂ තුනකට විශේෂ ස්වයං රැකියා ඇති කිරීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කෙරේ. අප විසින් ආරම්භ කරන සමෘද්ධි මධ්‍යස්ථාන මෙම කාර්යයේදී පුරෝගාමීව කටයුතු කරනු ඇත.
3. දශ ලක්ෂයකට රැකියා දීමේ වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමේ දී ඒ වෙනුවෙන් පහත සඳහන් ආර්ථික හා සංවර්ධන ක්‍රියාමාර්ග වහා ආරම්භ කරනු ඇත.
   i. සුළු හා මධ්‍යම පරිමාණයේ කර්මාන්තත්, මහා පරිමාණ කර්මාන්තත් ක්‍රමවත්ව සීග්‍ර ලෙස වර්ධනය කෙරේ.
   ii. ස්වයං රැකියා සඳහා අවශ්‍ය වෘත්තිය පුහුණුව, කළමනාකාර පුහුණුව හා ණය පහසුකම් සපයනු ලැබේ.

iii. මේ සඳහා දේශීය හා විදේශීය ආයෝජකයන්ට සියලු පහසුකම් සහිතව ආරාධනා කෙරේ.

iv. මහා මාර්ග, විදුලිය, විදුලි පණිවුඩ භූවමාරු වාරිමාර්ග පහසුකම් පුළුල්ව වැඩි දියුණු කිරීම සඳහා විදේශ මුදල් හා තාක්ෂණික ආයෝජනයන් ලබා ගනු ලැබේ.

v. ආත්ම ගෞරවයක් හා ආරක්ෂාවක් ඇතුව විදේශීය රැකියා කිරීමේ පහසුකම් වැඩි දියුණු කිරීම කරන අතර, ඒ සඳහා අවශ්‍ය වෘත්තිය පුහුණුවීම් හා විදේශගත රැකියා කිරීමේ මූලික පුහුණු වීම් සඳහා වැඩ පිළිවෙලක් සකස් කරනු ඇත.

vi. විදේශ රැකියා ඉඩ ප්‍රස්ථා වැඩි කරන අතරම, ඔවුනට අතරමැදියන්ගෙන් සිදුවන අසාධාරණකම් සම්පූර්ණයෙන් අවසන් කිරීමේ විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරනු ඇත.

4. වෘත්තියමය අධ්‍යාපනයක් ලබා තිබෙන දේශීය හා බටහිර වෛද්‍යවරු, ඉංජිනේරුවන් ඇතුළු වෘත්තිමය උපාධි ඩිප්ලෝමා සහ අනෙකුත් සහතික ලබාගත් අයට ස්වාධීන, පෞද්ගලික වෘත්තිය ආයතන පිහිටුවා ගැනීම සඳහා විශේෂ සහනාධාර ක්‍රමයකට මැදි හා දිගුකාලීන ණය පහසුකම් ලබා දීමේ විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරනු ඇත.

## අධ්‍යාපනය

අප රටේ නිදහස් අධ්‍යාපනය නැතිවී යාමේ තර්ජනයකට මුහුණ පා සිටින මේ අවස්ථාවේ දී, විශ්ව විද්‍යාල අධ්‍යාපනය ද ඇතුළුව සෑම මට්ටමක නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කර වර්ධනය කිරීම සහ ජාතික අධ්‍යාපනය වෙළඳපොළ බලවේග වල ග්‍රහණයට හසුවීම වැළැක්වීම පොදුජන එක්සත් පෙරමුණේ අධිෂ්ඨානයයි.

පුරවැසියන්ටත් මුළු සමාජයටත් ඉහළ ජීවන මට්ටමක් සහතික කරන්නාවූත්, ජාතික සමගිය හා සාමය, ආර්ථික සහ සමාජ ප්‍රගතිය, මානවවාදී සදාචාරාත්මක හා සංස්කෘතිමය හරයන් යන මේවා පෝෂණය කරන්නාවූත්, ජාතික අධ්‍යාපන ක්‍රමයක් අපි සකස් කරන්නෙමු. ප්‍රජාතන්ත්‍රවාදී ආකල්ප දරුවන් තුළ ඇති කරන සහ ඔවුන් මත්ද්‍රව්‍ය, මත්පැන් සහ සමාජ විරෝධී චර්යාවන් ගෙන් ඈත් කිරීම ඉලක්ක කර ගෙන අධ්‍යාපන ක්‍රියාදාමය ප්‍රතිසංස්කරණය කරන්නෙමු.

පාසල් නොයන දරුවන් සහ පාසල් අධ්‍යාපනය අත හැර දමන දරුවන් පිළිබඳ ප්‍රශ්ණයට විසඳුම් වශයෙන්, පාසැල් යන වයසේ සෑම දරුවෙකුට ම පාසැලක් ලැබීම සහතික කිරීමට අවශ්‍ය නිසි පියවර අපි ගන්නෙමු. සෑම දරුවෙකුම අඩු තරමින් අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය දක්වා පාසැල් යන බව සහතික කිරීම සඳහා අවශ්‍ය සෑම පියවරක් ම ගන්නෙමු.

21 වැනි සියවස සඳහා අපේ අනාගත පරපුර සූදානම් කිරීමේදී මතුවන අධ්‍යාපනික අවශ්‍යතා සැලකිල්ලට ගෙන, ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් අද ඇතිවී තිබෙන වර්ධනයන්ට අනුකූල උසස් මට්ටමේ අධ්‍යාපනයක් අප රටේ දරුවන්ට ලබාදීමට, පොදුජන එක්සත් පෙරමුණ විශේෂයෙන්ම බලාපොරොත්තු වෙයි. නූතන ලෝකයේ සාර්ථක ලෙස ජීවත් වීමට අවශ්‍ය විද්‍යාත්මක සහ තාක්ෂනික අධ්‍යාපනය පුළුල් කිරීමට අප වැඩ පිළිවෙලක් යොදන්නෙමු.

අනෙකුත් භාෂා ඉගැන්වීමටත්, ජාත්‍යන්තර භාෂාවක් වශයෙන් ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගැනීමට ඇති අවකාශ සහ පරිගණක අධ්‍යාපන අවකාශ පුළුල් කිරීමටත් පියවර ගනු ඇත. මේ විශේෂ පුහුණු පාඨමාලා පාසැල් වේලාවෙන් පසු සහ සති අන්තවල පවත්වනු ඇත. පාසැල් සහ වැඩ කරන ස්ථාන ඒ පුහුණු පාඨමාලා පැවැත්වීමට යොදා ගැනේ.

සිංහල සිසුනට දෙමළ භාෂාව ඉගෙන ගැනීමටත්, දෙමළ සහ මුස්ලිම් සිසුනට සිංහල ඉගෙන ගැනීමටත්, විශේෂ වැඩ පිළිවෙලක් සකස් කරන්නෙමු.

ශ්‍රී ලංකාවේ ඇති එක් අවාසනාවන්ත තත්ත්වයක් නම්, උසස් අධ්‍යාපන ආයතන වලට ඇතුලත් කරගනු ලබන්නේ අපේ තරුණ පිරිසෙන් ඉතා අඩු ප්‍රතිශතයක් වීමයි. මේ ගැටළුවට පිළියම් යෙදීම සඳහා, රට පුරා අලුත් උසස් අධ්‍යාපන ආයතන ගණනාවක්ම පිහිටුවනු ඇත. උසස් අධ්‍යාපන ආයතන වලට ප්‍රවේශ වීමේ ප්‍රතිපත්තිය යළි සකස් කිරීම මගින්, උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන් දැනට ඇති සමාජ, ආර්ථික සහ ප්‍රාදේශීය විෂමතා ඉවත් කිරීමට පියවර ගැනේ. පෞද්ගලික විශ්වවිද්‍යාල පිහිටුවනු නොලැබේ.

## විශ්වවිද්‍යාල අධ්‍යාපනය

සමස්ත විශ්වවිද්‍යාල පද්ධතියේ ම දැනට ඇති වී තිබෙන තියුණු අර්බුදය ගැන පොදුජන එක්සත් පෙරමුණේ විශේෂ අවධානය යොමු වී තිබේ. අප රටේ විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලැබෙන්නේ ද්විතීයික අධ්‍යාපනය ලබන තරුණ පරපුරෙන් ඉතා සුළු ප්‍රතිශතයකටයි. විශ්ව විද්‍යාල පද්ධතිය පුළුල් කිරීම මෙන්ම සිසු සිසුවියන්ගේ නේවාසිකාගාර, ශිෂ්‍යාධාර, ගමනාගමන සහ අධ්‍යාපනයෙන් පසු ඔවුන් මුහුණ දෙන රැකියා ගැටළුව ගැන අපි අවබෝධයෙන් සිටින්නෙමු. අවශ්‍ය තරම් මූල්‍ය ප්‍රතිපාදන නොමැතිකමින් ආචාර්ය මණ්ඩල හිඟය, ගොඩනැගිලි, පර්යේෂණ පහසුකම්, ආචාර්ය සහ කාර්ය මණ්ඩලවල නිවාස ප්‍රශ්නය, පුස්තකාල පහසුකම් යනාදී ප්‍රශ්න කාලයක් තිස්සේ ම උග්‍ර වී තිබේ.

දැනට පවතින විශ්වවිද්‍යාල පද්ධතිය සහ අධ්‍යාපන ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීමටත්, දියුණු කිරීමටත්, ආචාර්ය, ශිෂ්‍ය සහ කාර්ය මණ්ඩල යන සියළු විශ්ව විද්‍යාල ප්‍රජාවන්ගේ සියළු අදහස් විමසා විශේෂ වැඩ පිළිවෙලක් සකස් කර, ක්‍රියාත්මක කිරීමට පොදුජන එක්සත් පෙරමුණ කැප වී සිටී. එම වැඩ පිළිවෙලෙහි පහත සඳහන් පියවරයන් ද අඩංගු විය යුතු බව අපි විශ්වාස කරමු.

i. විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය රැක ගැනීම සහ ඉහළ නැංවීම.
ii. නවීන ලෝකයට අවශ්‍ය වන විද්‍යාත්මක කළමණාකරණ අධ්‍යාපනය ලබාදීම පිණිස නව පාඨමාලා හඳුන්වා දී හා පවත්නා පාඨමාලා සංශෝධනය කිරීම.
iii. ආචාර්ය හා කාර්ය මණ්ඩලවල වැටුප් විෂමතා විසඳීම.
iv. උපාධිධාරීන්ගේ රැකියා පිළිබඳ ගැටළු විසඳීමට රාජ්‍ය සහ පුද්ගලික අංශ සමඟ සහයෝගයෙන් නව වැඩ පිළිවෙළක් සකස් කිරීම.
v. සියළු විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට නේවාසික පහසුකම් සැපයීම.
vi. ආචාර්ය සහ කාර්ය මණ්ඩලවල නිවාස ප්‍රශ්නය විසඳීමේ ක්‍රියා මාර්ග.
vii. වැඩි වන ශිෂ්‍ය ප්‍රමාණයට සරිලන ලෙස ආචාර්ය මණ්ඩල ව්‍යාප්ත කිරීම.
viii. විශ්වවිද්‍යාලවල සෑම අධ්‍යයන අංශයකම පර්යේෂණ අරමුදල් සහ පර්යේෂණ පහසුකම් ව්‍යාප්ත කිරීම.
ix. සරසවි පුස්තකාලවල තත්ත්වය දියුණු කිරීම සහ සිංහල හා දෙමළ භාෂාවලට ග්‍රන්ථ පරිවර්තනය කිරීම.

ඊට අමතරව විශ්ව විද්‍යාල පද්ධතිය සමඟ සාකච්ඡා කිරීමෙන් පසු, විශ්වවිද්‍යාල ප්‍රවේශය සම්බන්ධයෙන් දැනට ඇති ප්‍රමාදය වහාම විසඳීමට ද අපි පියවර ගන්නෙමු.

## ගුරු සේවය

ගුරුවරුන්ගේ ආත්ම ගරුත්වය කෙලෙසා ඇති වත්මන් දේශපාලන බලපෑම්වලට ගොදුරු වූ ගුරු සේවය නිදහස්, නිවහල්, අභිමානවත් සේවයක් ලෙස පිහිටුවීමට අවශ්‍ය වන සියළු දේශපාලන බලපෑම් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.

වෘත්තිමය වශයෙන් පුහුණුව ලත් ගුරුවරුන්ගෙන් සමන්විත උසස් මට්ටමේ ගුරු සේවයක් ඇති කිරීමට අපි කටයුතු කරමු. ගුරුවරුන් බඳවා ගැනීම සහ ඔවුන්ට උසස්වීම් දීම සම්පූර්ණයෙන්ම සුදුසුකම් මත පමණක් සිදුවන අතර, ඔවුන් පාසල්වලට අනුයුක්ත කිරීමේදී, පාසැල් අධ්‍යාපනයට පිටස්තර හේතු කිසියේත්ම සැලකිල්ලට නොගනු ඇත. ගුරුවරුන්ගේ වැටුප් ඔවුන්ගේ සුදුසුකම් සහ වෘත්තිමය තත්ත්වයට ගැලපෙන පරිදි සකස් කරන්නෙමු. නිවාස, සෞඛ්‍ය රක්ෂණය සහ දුෂ්කර පළාත්වල සේවය කරන ගුරුවරුන්ගේ දරුවන්ට විශේෂ ශිෂ්‍යත්ව ලබාදීම යනාදිය අඩංගු සුභසාධන වැඩ පිළිවෙලක් ද ක්‍රියාත්මක කරන්නෙමු.

ගුරුවරුන්ගේ අවශ්‍යතාවලට සේවය කෙරෙන පරිදි සහ ඔවුන්ට පුහුණු වීම සහ සේවා පහසුකම් සහතික කිරීමටත්, රැකියාවේ ඉහළ යාමේ අවකාශ ලබා දීමටත්, ගුරු සේවයේ ගුණාත්මක තත්ත්වය දියුණු කිරීමටත්, තුඩු දෙන විශේෂ ගුරු සේවාවක් ආරම්භ කිරීමට පියවර ගන්නෙමු. මෙම ගුරු සේවාව පිහිටුවීමේදී, ගුරුවරුන්ගේ වෘත්තීය සමිතිවල අදහස් විමසා බලන්නෙමු.

## වැඩිහිටි අධ්‍යාපනය

වැඩිහිටි සහ අඛණ්ඩ අධ්‍යාපන පහසුකම් ව්‍යාප්ත කිරීමට, විශේෂයෙන් සාක්ෂරතාව, නීතිය පිළිබඳ දැනුම, භාෂා සහ වෘත්තිය පුහුණුව, වැඩිහිටි පිරිස්වලට නව පුහුණුව ලබා දීම, ක්‍රමික අධ්‍යාපනය නොලැබූ වැඩිහිටි අයට අධ්‍යාපනය ලබාදීම යන මේවා ඉලක්ක කරගත් විශේෂ අධ්‍යාපන වැඩ පිළිවෙලවල් සකස් කර ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ අවිධිමත් පුහුණු ආයතන, පුද්ගලික අංශය සහ රාජ්‍ය නොවන සංවිධාන සහභාගී කර ගන්නෙමු.

## පිරිවෙන් අධ්‍යාපනය

පිරිවෙන් අධ්‍යාපනය දියුණු කිරීම සඳහාත් ක්‍රමවත් කිරීම සඳහාත් රජය විසින් විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

1. පිරිවෙන් අධ්‍යාපනය තුළින් උතුම් බෞද්ධ දර්ශනයේ විද්‍යාත්මක බව අවබෝධ කිරීමේ හා බෞද්ධ මූලධර්ම ගිහි ශිෂ්‍යයන්ට ද ඉගැන්වීමේ විශේෂ වැඩ පිළිවෙලක් දියත් කරනු ඇත.
2. සිංහල, පාලි, සංස්කෘත යන භාෂාවන් ඉගැන්වීම හා පිරිවෙන් විභාග අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා රජයේ විශේෂ අනුග්‍රහය ලබා දෙනු ඇත.
3. පිරිවෙන් පුස්තකාල දියුණු කිරීමටත් පිරිවෙන් වලට අවශ්‍ය අනෙකුත් උපකරණ සැපයීමත් රජයේ විශේෂ අනුග්‍රහය ලැබෙනු ඇත.

## දහම් පාසැල්

සෑම පාසැල් දරුවෙකුට ම දහම් පාසල් අධ්‍යාපනයක් ලබා දීමට විශේෂ ජාතික වැඩ සටහනක් පිරිවෙන් හා විහාරස්ථාන ආශ්‍රයෙන් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

## පෙර පාසල් අධ්‍යාපනය

1. ලංකාවේ සෑම ගමකම පෙර පාසලක් ඇති කිරීමටත්, තිබෙන පෙර පාසල් දියුණු කිරීමටත්, පෙර පාසල් අධ්‍යාපනය ක්‍රමවත් කිරීමටත්, සෑම දරුවකුටම නොමිලේ පෙර පාසල් අධ්‍යාපනය ලබා ගැනීමටත් හැකි වන අයුරින් විශේෂ ජාතික වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කෙරෙනු ඇත. මේ සඳහා ස්වේච්ඡා ආයතන හා පෞද්ගලික පෙර පාසල් වලට රාජ්‍ය අනුග්‍රහය ලබා දීමත්, පෙර පාසල් ගුරුවරු පුහුණු කිරීමේ විශේෂ වැඩ පිළිවෙලක් පෞද්ගලික හා ස්වේච්ඡා සංවිධාන සමග සංවිධානය කිරීමත් ඇතුළත් වේ.

# සෞඛ්‍යය

අප රටේ අවුරුදු 5 ට අඩු දරුවන්ගෙන් 40% ක් ම මන්දපෝෂණයෙන් පෙළෙන අතර, ගැබ්බර කාන්තාවන්ගෙන් 60% ක් පමණ රක්ත හීනතාවයෙන්ද, මන්දපෝෂණයෙන් ද පෙළෙති. ඉපදෙන දරුවන්ගෙන් 27% ක් පමණ සාමාන්‍ය බරට වඩා අඩුය. ළදරුවන්ගේ සහ මව්වරුන්ගේ මන්ද පෝෂණය තුරන් කිරීම පොදුජන එක්සත් පෙරමුණේ ප්‍රධානම ක්‍රියා මාර්ගික ඉලක්කයක් වනු ඇත.

. රෝග වැළැක්වීමේ මාධ්‍යයන් කෙරෙහි ද අපි විශේෂ අවධානය යොමු කරමු. එ.ජා.ප. රජය මේ ගැන නොසලකා හැරීම නිසා, මුළු ජනතාවගේම සෞඛ්‍ය තත්ත්වයට හානි සිදු වී තිබේ. දැනට ඇති නාගරික ප්‍රධාන රෝහල්වල අවශ්‍යතාවයන් වහාම සපයන අතර, දුෂ්කර සහ පහසුකම් රහිත ප්‍රදේශවල සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවීමට අපි විශේෂයෙන් උනන්දු වන්නෙමු. සෑම දිස්ත්‍රික්කයකම වසරකට එකක් බැගින් දිස්ත්‍රික් රෝහල්වල තත්ත්වය නගා සිටුවීමට අවශ්‍ය සම්පත් විශේෂඥ සේවා සපයනු ඇත. සෑම දිස්ත්‍රික් රෝහලකටම රසායනාගාර සහ එක්ස්රේ වැනි මූලික පහසුකම් ද සපයන්නෙමු. සෑම ප්‍රාදේශීය රෝහලකටම ගිලන් රථ සේවාවක් සපයන්නෙමු.

ලෝක සෞඛ්‍ය සංවිධානය දැනට කර ඇති වර්ගීකරණයට අනුව, බෙහෙත් වර්ග 270 ක් පමණ අත්‍යාවශ්‍ය බෙහෙත් ලෙස සැළකේ. රටේ විශේෂ ඉල්ලුමක් තිබෙන බවත් බෙහෙත් ද්‍රව්‍ය 50 ක් ද හඳුනාගෙන, එම බෙහෙත් රට පුරාම රජයේ රෝහල් වලින් ලබා ගැනීමට අවශ්‍ය පියවර ගන්නෙමු. ඊට අමතරව, මහරගම පිළිකා රෝහලේ උපදේශක වෛද්‍යවරුන් විසින් නියම කරනු ලබන ඕනෑම බෙහෙතක්, රජය විසින් නොමිලේ සැපයෙනු ඇත.

පෞද්ගලික අංශය, සෞඛ්‍ය සේවා සැපයීමේ අංශයට සහභාගි වීම අපි උනන්දු කරන්නෙමු. පෞද්ගලික රෝහල් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිරන්තර අධීක්ෂණයට භාජනය කරනු ලබන අතර, ඒවායේ නිසි තත්ත්ව පාලනයක් පවත්වාගෙන යෑම ද සහතික කරන්නෙමු.

නිසි සෞඛ්‍ය සහ වෛද්‍ය පහසුකම් නොලැබෙන, වරප්‍රසාද රහිත ජන කොටස් හඳුනාගෙන, ඔවුන්ට ක්ෂණික සහ දැඩි සත්කාර වෛද්‍ය පහසුකම් ලැබෙන වැඩ පිළිවෙලක් සකස් කරනු ඇත. අපේ ජනගහණයෙන් 4% කට පමණ විවිධ ශාරීරික ආබාධ තිබේ. මන්දපෝෂණය නිසා අන්ධ භාවය ද පැතිරෙමින් තිබේ. මේ ජනතාව වෙනුවෙන් විශේෂ සහ ක්ෂණික ප්‍රතිකාර වැඩ පිළිවෙලක් සකස් කරන්නෙමු. රාජ්‍ය නොවන ආයතන වලටත්, ප්‍රජාවගේත්, ආධාරය ඇතිව, ශාරීරික ආබාධ වලින් පෙළෙන දරුවන් රැකබලා ගැනීමේ මධ්‍යස්ථාන පිහිටුවීමට අවශ්‍ය පහසුකම් සපයන්නෙමු.

විශ්ව විද්‍යාලවල වෛද්‍ය පීඨ සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් අනුව, හෙද අභ්‍යාස විද්‍යාලවල පාඨමාලා, සංශෝධනය කරනු ලැබේ. එමෙන්ම හෙද අභ්‍යාස විද්‍යාලවල ඉගැන්වීමේ පහසුකම් වැඩි දියුණු කිරීමට ප්‍රමාණවත් සම්පත් ද සපයන්නෙමු.

ආයුර්වේදය ඇතුළු දේශීය වෛද්‍ය ක්‍රම ද, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ද දියුණු කිරීමට හැකි සෑම පියවරක්ම අප විසින් ගනු ලැබෙනු ඇත.

## ගමනාගමනය

නාගරික මෙන්ම ග්‍රාමීය පෙදෙස්වල ද රාජ්‍ය සහ පුද්ගලික ගමනා ගමන සේවය දියුණු කිරීමේ අවශ්‍යතාවය අපි ඉතා වැදගත් කොට සලකමු.

මහජනතාවගේ ගමනා ගමන පහසුකම් මෙන්ම ගමනා ගමන සේවයේ තත්ත්වය ඉහළ නැංවීම අරමුණු කර ගෙන, කුඩා බස් ධාවනය අවසන් කිරීමටත්, උස් වහළ සහිත බස් ධාවනය කිරීමටත්, පුද්ගලික බස් හිමිකරුවන් උනන්දු කරන්නෙමු. උස් වහළ සහිත බස් ආනයනය කිරීම දිරිගැන්වීමට, ඒ සඳහා දැනට ඇති ආනයන බදු අඩු කරන්නෙමු. අඩු එන්ජින් ධාරිතාවක් ඇති මෝටර් සයිකල් සහ ත්‍රිරෝද රථ ආනයනය කිරීමේදී දැනට අය කරන බදු අහෝසි කරනු ඇත.

නව කාර්ය මණ්ඩලයන්ට ගමනාගමන පහසුකම් සළසන ලෙස පුද්ගලික අංශයේ කර්මාන්ත ශාලා හා ව්‍යාපාරික ආයතන දිරිගන්වමු. මේ සඳහා අවශ්‍ය බස් රථ ආනයනය කිරීමට පුද්ගලික අංශයට පහසුකම් සපයනු පිණිස ආනයන පහසුකම් මෙන්ම මූල්‍ය දිරිගැන්වීම් ද සැපයේ. පළාත් සභා මගින් මෙහෙයවන පාසැල් බස් සේවය දියුණු කෙරේ.

දැනට ක්‍රියාත්මක වන බස් ධාවන මාර්ග පිළිබඳව ප්‍රවේශමෙන් පරීක්ෂා කර බලා, සතුටුදායක බස් සේවාවක් සැපයීමට අවශ්‍ය වෙනස් කිරීම් හඳුන්වා දෙනු ඇත. මහජනතාවට පහසුකම් සහ උසස් තත්ත්වයෙන් යුත් බස් ගමනාගමන සේවාවක් සහතික කරනු පිණිස, ධාවනය වන බස් රථවල තත්ත්වය නිතිපතා පරීක්ෂා කරනු ඇත. මහජනයාට ආචාරශීලී සහ සුහද සේවයක් සැපයීමත්, මාර්ග නීති රැකීමත්, මගීන්ගේ ආරක්ෂාවත් සහතික කරන පරිදි ගමනා ගමන සේවකයින්ට විශේෂ පුහුණුවක් ද සපයනු ඇත.

පවත්නා දුම්රිය සේවාව පණ ගන්වා ව්‍යාප්ත කිරීමට විශේෂ ක්‍රියාමාර්ග ගැනීමට ද අපි අදහස් කරමු. දුම්රිය මගීන්ට මුහුණ පෑමට සිදුව ඇති දුෂ්කරතා පිළිබඳව දැඩි අවධානය යොමු කොට නියි පිළියම් යොදමු.

## ක්‍රීඩා හා ශාරීරික ක්‍රියාකාරකම්

01 සමාජ හා ආර්ථික සංවර්ධන ක්‍රියාදාමයේ ප්‍රධාන සම්පත වන ජනතාවගේ මානසික හා ශාරීරික නිරෝගි බවත් හික්මීමත් ඇති කිරීමේ තීරණාත්මක අංශයක් ලෙස අපි ක්‍රීඩා හා ශාරීරික ක්‍රියාකාරකම් අංශය සලකමු.

02. මේ නිසා ළමා, තරුණ වැඩිහිටි සියලු දෙනාටම බලපාන ජාතික ක්‍රීඩා පද්ධතියක් නිර්මාණය කර ක්‍රියාත්මක කරනු ඇත.

03. ක්‍රීඩා ක්ෂේත්‍රයේ ඇති පවු භේද හා අසමතුලිතතාවයන් ඉවත් කිරීමේ විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කෙරේ.

04. ක්‍රීඩාවේ උත්තරීතර බවට හා පිවිතුරු බවට කැලැල් වෙන කිසිදු ක්‍රියා මාර්ගයක් ගැනීමට කිසිවකුට ඉඩ නොතබන අතර එවැනි අය ඇතොත් ඔවුන් ක්‍රීඩා ක්ෂේත්‍රයෙන් සහමුලින් ඉවත් කෙරේ.

05. මලල ක්‍රීඩා හා වොලි බෝල්, ක්‍රිකට් වැනි ක්‍රීඩාවන් රට පුරා ව්‍යාප්ත කිරීමට හා වර්ධනය කිරීමට අවශ්‍ය ජාතික වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකටම හා සෑම පාසැලකටම මේ සඳහා අවශ්‍ය පහසුකම් සැපයේ.

06. ක්‍රීඩා දක්ෂතා ඇති දරුවන්ට පහසුකම් ඇති පාසල්වලට ඇතුල්වීමේ විශේෂ වරප්‍රසාද හා පෝෂණ ආධාර ක්‍රමයක් ඇති කරනු ඇත.

07. ජාතික හා ජාත්‍යන්තර මට්ටමට පත් ක්‍රීඩක – ක්‍රීඩිකාවන්ගේ ආධාර උපකාර ක්‍රීඩාවේ උන්නතිය සඳහා යොදවා ගැනීමට විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරනු ඇත.

08. ක්‍රීඩා පාලක මඩුලු දේශපාලන බලපෑම් වලින් සහමුලින් ඉවත් කෙරේ.

09. ක්‍රීඩා පාලක මඩුලුවල මුදල් පරිහරණය, කළමනාකරණය, ශිෂ්‍යත්ව හා විදේශ සංචාරක කටයුතු අවංක ලෙසත්, නිවැරදි ලෙසත්, සාධාරණවත් ඉටු කිරීමට අවශ්‍ය විධි විධාන යොදනු ඇත.

10. දිස්ත්‍රික් මට්ටමෙන් ක්‍රීඩා පාසැල් ආරම්භ කිරීමේ ජාතික වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කෙරේ.

## නිවාස

01. සෑම පවුලකටම දේශගුණයට, පරිසරයට හා අවශ්‍යතාවයන්ට අනුව නිවසක් තනා ගැනීමට ඇති අයිතිය සුරැකීමට විශේෂ ජාතික වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

02. නගරබද හා වෙරළබඩ පැල්පත් වාසීන්ටත්, ග්‍රාමීය ජනතාවටත් වඩා හොඳ නිවාස ලබාදීමේ කාර්යයට ඉහළම ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ.

03. මධ්‍යම පංතික හා පහළ මධ්‍යම පංතික පවුල් වල නිවාස ප්‍රශ්ණය විසඳීම පිණිස ඔවුන්ගේ ආදායම් වලට ගැලපෙන නිවාස යෝජනා ක්‍රමයක් ක්‍රියාවට නගනු ඇත.

04. ප්‍රචාරය වෙනුවෙන් කරන නාස්තියත්, දූෂණය හා වංචාවත් පිටුදැක නිවාස වෙනුවෙන් රජය වැය කරන සෑම ශතයක්ම නිවාස සඳහා යොදවනු ඇත.

05. වැටුප් ලබන සියලු සේවකයන්ට ඉතා පහසු ක්‍රමයට හා අඩු පොලියට නිවාස ණය ලබා ගැනීමට හැකි වන අයුරින් හා රැකියා නියුක්තිකයන්ගේ පළමු වැටුපේ සිටම අනිවාර්යයෙන්ම දායක වන ආකාරයේ ජාතික නිවාස අරමුදලක් ගොඩනගනු ඇත. එම අරමුදලෙන් සහනදායි ක්‍රමයට සියලු දෙනාට නිවාස ණය ලබා ගත හැකි වනු ඇත.

06. නිවාස තැනීමට අවශ්‍ය ඉඩම්, සිමෙන්ති, ගල්, වැලි හා අනෙකුත් උපකරණ අඩු මුදලට හා පහසුවෙන් ලබාගත හැකි ක්‍රම සම්පාදනය කරනු ඇත.

07. අළුතෙන් විවාහ වන අයට සිය අවශ්‍යතාවන් අනුව නිවාසයක් තනා ගැනීමට රජය විසින් සහනාධාර ක්‍රමයට ඉඩම් මූල්‍ය පහසුකම් ලබාදීමේ විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වනු ඇත.

## රැකියා නියුක්තීන්ගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද

රැකියා නියුක්තීන්ගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද සුරකෙන කම්කරු ප්‍රඥප්තියක් සම්මත කොට එය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විධිවිධාන යොදනු ඇත.

මෙම ප්‍රඥප්තියට පහත සඳහන් විධිවිධාන ඇතුළත් වනු ඇත.

01. **වෘත්තිය සමිති අයිතීන්**

වෘත්තිය සමිති අයිතීන් යටතේ හාම්පුතුන් වෘත්තිය සමිති පිළිගැනීම අනිවාර්ය කිරීම, වෘත්තිය සමිති වලට පහසුකම් සැපයීම හා වෘත්තිය සමිති නිලධාරීන්ට ආරක්ෂාව සැපයීම, ජාතික මට්ටමේ වෘත්තිය සමිති වලට විශේෂ පහසුකම් ලබාදීම, වැඩ වර්ජන මැඩ පැවැත්වීම සඳහා හදිසි නීතිය උපයෝගී කර නොගැනීම, ජාත්‍යන්තර කම්කරු ප්‍රඥප්තීන් සම්මත කිරීම යන කරුණු අඩංගු වනු ඇත.

02. **කාර්මික සම්බන්ධතා**

මෙම විෂය යටතේ සාමූහික ගිවිසුම් ක්‍රමය ව්‍යාප්ත කිරීම, ගෘහස්ථ විනය පරීක්ෂණ ක්‍රමය විධිමත් කිරීම, කම්කරු විනිශ්චය සභාවල බලතල පුළුල් කිරීම, කාර්මික ආරවුල් පනත කාලානුරූපව සංශෝධනය කිරීම, කාර්මික ආරවුල් යොමු කිරීම සඳහා විශේෂ අධිකරණයක් පිහිටුවීම යන කරුණු ඇතුළත් වේ.

03. **වැටුප් සහ සේවා කොන්දේසි**

මෙම විෂය යටතේ ජාතික වැටුප් කොමිෂමක් ඇති කිරීම, සෑම සේවකයෙකුටම පත්වීම් ලිපි නිකුත් කිරීම අනිවාර්ය කිරීම, නිත්‍ය සේවයක් සඳහා අනියම් පදනමින් සේවකයින් යෙදවීම තහනම් කිරීම, සමාන සේවයට සමාන වැටුප් ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම යන කරුණු අඩංගු වනු ඇත.

04. **සමාජ රක්ෂණය**

මෙම විෂය යටතේ, අර්ථසාධක අරමුදලට අමතරව විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඇති කිරීම, ආයතනවල වෛද්‍ය රක්ෂණ ක්‍රම ඇති කිරීම, අනතුරු සහිත රැකියාවල යෙදෙන්නන් සඳහා විශේෂ රක්ෂණ ක්‍රම ඇති කිරීම යන කරුණු ඇතුළත් වේ.

05. **සුභසාධනය සහ සමීපාරක්ෂාව**

ආයතන තුළ සුභ සාධන කමිටු පිහිටුවීම, ජාතික සේවක බැංකුවක් පිහිටුවීම යන කරුණු මෙම විෂයට අඩංගු වේ.

06. **අහිමි වූ වරප්‍රසාද නැවත ලබාදීම**

1977 න් පසු දේශපාලන හා වෘත්තිය සමිති හේතූන් මත රැකියා අහිමි වූ හා වෙනත් අන්දමින් පළිගැනීම් වලට ලක් වූ සියලු දෙනාට පූර්ණ සහන සැලසීම පුද්ගලීකරණය හේතු කොට ගෙන රැකියා අහිමි වූ අයට වෙනත් ආයතනවල ඇබෑර්තු පිරවීමේ දී ප්‍රමුඛත්වය දීම මෙම විෂයට අයත් වේ.

07. **ජනසතු ව්‍යාපාර**

රටේ ජන ජීවිතයට බලපාන හා ජාතික වැදගත්කමක් ඇති ව්‍යාපාර හා ලාභදායී ව්‍යාපාර තවදුරටත් ජනසතු ව්‍යාපාර වශයෙන් පවත්වා ගෙන යාම, එම ව්‍යාපාරවල පරිපාලනය කාර්යක්ෂම කිරීම, එතුවල අයිතිය රජය යටතේ තබා ගනිමින්, කළමනාකරණය ක්‍රමවත් කිරීම, එතු කම්කරුවන්ට නිවාස යෝජනා ක්‍රම ඇති කොට ඔවුන්ගේ සෞඛ්‍ය හා අධ්‍යාපන සේවාවන් දියුණු කිරීම, සමුපකාර ව්‍යාපාරය සම්පූර්ණයෙන් ප්‍රතිසංවිධානය කිරීම, රාජ්‍ය ප්‍රවාහන සේවය වැඩිදියුණු කිරීම සඳහා පූර්ණ රාජ්‍ය අනුග්‍රහය ලබා දීම යන කරුණු මෙම විෂයට ඇතුළත් වේ.

08. තරුණ වෘත්තීය සමිති ක්‍රියාකාරින්ට විශ්ව විද්‍යාල මට්ටමේ අධ්‍යාපනයක් ලබා දීම සඳහා හා විදේශීය පුහුණුවීම් ලබාදීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරනු ඇත. මීට අමතරව ජාතික වශයෙන් වෘත්තීය සමිති අභ්‍යාස ආයතනයක් පිහිටුවීමට ද ක්‍රියා කරනු ඇත.

## වතුකරයේ වැඩ කරන ජනතාව

01. වතුකරයේ වැඩ කරන කම්කරු ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට හා පරිසරය හා සෞඛ්‍ය තත්ත්වය දියුණු කිරීමට විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කෙරේ.
02. වතුකරයේ ඇති නිවාස ප්‍රශ්නය වහා විසඳීම සඳහා කඩිනම් නිවාස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කෙරේ.
03. වතුකරයේ අධ්‍යාපන මට්ටම දියුණු කිරීම සඳහා විශේෂ ක්‍රියාමාර්ග ගැනීම.
04. වතුකරයේ නිවාස වලට විදුලිය, ජලය හා මාර්ග පහසුකම් සැපයීමේ වැඩ පිළිවෙළක් වහා ක්‍රියාත්මක කෙරේ.
05. වතු කම්කරුවන්ට ස්ථිර මාසික ආදායමක් සහතික කිරීම සඳහා ස්ථිරසාර වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නෙමු.
06. වතුකරයේ මව්වරුන්ට හා කුඩා ළමුන්ට විශේෂ රැකවරණය හා පහසුකම් සලසන වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කෙරෙනු ඇත.
07. ඉන්දීය සම්භවයක් ඇති සුළු ජාතික කොටසක් ලෙස සැලකීම නිසා වතුකරයේ, ද්‍රවිඩ ජනතාවට මතුවන විශේෂ ගැටළු හා ප්‍රශ්න විසඳීමට අවශ්‍ය සියලු විධිවිධාන යොදනු ඇත.
08. සියලු පුරවැසියන් සාමාන්‍ය පුරවැසියන් ලෙස සැලකීමට අවශ්‍ය නීතිරීති සම්පාදනය කරනු ඇත.
09. වතු කම්කරුවන් පදිංචි ජනාවාස ප්‍රාදේශීය සභා පාලනයට පත් කෙරේ.
10. වතු කම්කරුවන්ගේ වෘත්තීය අයිතීන් සුභසාධන පහසුකම් සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන යොදනවා ඇත.

## කාන්තාව

1993 දී පිළිගත් කාන්තාවන් පිළිබඳ ප්‍රඥප්තිය, පාර්ලිමේන්තු පණතක් මගින් නීතිගත කිරීමට අපි අදහස් කරමු. කාන්තාවන් පීඩනයට පත් වන ක්ෂේත්‍රයන් ගණනාවක පුළුල් ප්‍රතිසංස්කරණ ඇති කිරීමද අපේ අරමුණකි. විවාහය හා දික්කසාදය, කුඩා දරුවන්ගේ භාරකාරත්වය, ඉඩම් උරුමය, ගෙදර දොර ප්‍රචණ්ඩ ක්‍රියා සහ ලිංගික අපරාධ යන ක්ෂේත්‍රයන්හි මේ ප්‍රතිසංස්කරණ සිදු කෙරේ. රැකියා සම්බන්ධව කාන්තාවන්ට සමනැන ලැබීම සහතික කෙරෙන නීතිමය සහ පරිපාලනමය පියවරයන් ද ගන්නෙමු.

01. කාන්තාවන්ගේ ගෞරවය හා මාතෘත්වය ආරක්ෂා වන පරිදි ඔවුන්ට ශාරීරිකව හා මානසිකව සිදුවන පීඩා හා අසාධාරණකම් මග හැරවීම සඳහාත්, දැරියන් මෙහෙකාරකමට යොදාගෙන හිංසා කිරීම වැලැක්වීම සඳහාත්, අවශ්‍ය ඵලදායි නීති රීති සම්පාදනය කරන අතර, ඒවා නිවැරදිව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගනු ඇත.
02. විදේශ රටවල සේවයේ යෙදී සිටින සේවිකාවන් සඳහා රජයේ හා විදේශයන්ගේ අදාළ බලධාරීන් සමග බඳවා ගැනීම්, වැඩ තත්ත්වයන්, ආපසු පැමිණීම්, පිළිබඳ ශක්තිමත් කොන්දේසි හා ගිවිසුම් ඇති කොට ක්‍රියාත්මක කරනු ඇත.
03. පෝෂණ තත්ත්වය පහත වැටී තිබීම කාන්තාවන්ට සහ ගැහැණු දරුවන්ට තදබල ලෙස බලපා ඇති බැවින් ඒ සම්බන්ධව විශේෂ වැඩ පිළිවෙළක් අනුගමනය කරන අතර, පෝෂණ මට්ටම ඉහළ දැමීම, රැකියාවල යෙදීමේදී ඇති වන සෞඛ්‍ය බාධක ඉවත් කිරීම, වැනි අංශ පිළිබඳ විශේෂ සෞඛ්‍ය වැඩ සටහන් ක්‍රියාත්මක කෙරේ.

## තරුණ පරපුර

තරුණ පරපුර රටේ ආර්ථික, සමාජ, සංස්කෘතික සංවර්ධනයේ ජීවනාලිය වේ. අපේ ඉදිරි වගකීම් භාර ගැනීමට තරුණ පෙළට ස්වාධීනව පුදානම් වීම සඳහා අවශ්‍ය පරිසරය රජය විසින් නිර්මාණය කළ යුතු යයි අපි අදහස් කරමු. උගත්කම, බුද්ධිය, හැකියාව හා කුසලතාවය තරුණයා මැනීමේ මිනුම් දඬු විය යුතු අතර, ධනය, බලය, කුලය හෝ දේශපාලන සම්බන්ධතා මෙහිදී වැදගත් නොවිය යුතුය යන්න අපේ ප්‍රතිපත්තියයි.

තරුණ පෙළට ආවේනික වූ පෙරලිකාරී බව, විවේචනශීලී බව, නොඉවසනසුළු බව, විප්ලවකාරී බව, තරුණයා නිර්මාණශීලියෙකු හා පරිපූර්ණයෙකු කරන සාධක බව තේරුම් ගනිමින් තරුණ පරපුර ජාතික සම්පතක් වශයෙන් ගොඩ නැංවීම සඳහා සමාජයේ සෑම තැනකදීම ඔවුන්ව පිළිගැනීමටත්, නියෝජනයත් ඇති වන අයුරින් විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරනු ඇත.

පසුගිය භීෂණ යුගයේ ප්‍රතිඵලයක් ලෙස විනාශ වූ ග්‍රාමීය තරුණ ජීවය හා ඔවුන්ගේ ආත්ම ශක්තිය යළි උද්දීපනය වන ආකාරයේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනු ඇත.

ජාතික සංවර්ධන වැඩ පිළිවෙලේ ග්‍රාමීය හා ප්‍රාදේශිය මට්ටමේ නායකත්වය තරුණ පරපුරට බාරදීමට අවශ්‍ය විධි විධාන යොදවනු ඇත. විශේෂයෙන් සමූපකාර ව්‍යාපාරයේ නායකත්වය ඔවුන්ට බාර දෙනු ඇත.

## විශ්‍රාමිකයින්

1. රටේ යහපත වෙනුවෙන් හා සංවර්ධනය වෙනුවෙන් සිය ජීවිතයේ ශක්තිමත් වයස කැප කර තම සැඳෑ සමය විශ්‍රාම සුවයෙන් ගත කළ යුතු අපගේ විශ්‍රාමික ජනතාවට ඇති ප්‍රශ්න හා ගැටළු ගැන අපේ විශේෂ අවධානය යොමු කොට ඇත. බොහෝ දෙනෙකු තවමත් ජීවත් වෙන්නේ කුලී නිවෙස් වලය. දරුවෝ බාල වයස්වල පසුවෙති. විශ්‍රාම වැටුපෙන්ද විශාල වශයෙන් ණය මුදල් කැපේ. මේ තත්ත්වයන් වළකා විශ්‍රාමික සුභසාධනය සඳහා විශේෂ ජාතික වැඩ පිළිවෙලක් අප විසින් ක්‍රියාත්මක කරනු ඇත.
2. විශ්‍රාම වැටුප් සැකසීමේ දි ඇති සියළු විෂමතා අහෝසි කර, විශ්‍රාමික වැටුප උපරිම වන ලෙස ජාතික විශ්‍රාම වැටුප් ක්‍රමයක් සකස් කෙරේ. විශ්‍රාම වැටුප් ජීවන වියදම් දර්ශකයට අනුව සකස් කිරීමට පියවර ගන්නා අතර විශ්‍රාමිකයන්ට අඩු මිල ගමනා ගමන පහසුකම් ද සපයනු ඇත.
3. රු. 260/- දීමනාවේ හිඟ මුදල වහා ගෙවනු ලැබේ.
4. රජයේ ආයතනවල පුරප්පාඩු පිරවීමේදී එම ආයතනවල විශ්‍රාමිකයින්ගේ දරුවන් පිළිබඳව යම් විශේෂත්වයක් දැක්වීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරනු ඇත.
5. බොහෝ කාලයක් ගමින් පිටත සේවය කිරීමේ හේතුවෙන් විශ්‍රාමිකයින්ගේ දේපලවල සුරක්ෂිත භාවයට මතුවන ප්‍රශ්න නිරාකරණය කිරීම සඳහා විශේෂ විධි විධාන සැකසේ.
6. වැන්දඹු, අනත්දරු, අරමුදලට කපා ගන්නා ලද මුදල් සහ පොලිය ආපසු ලබා ගැනීමේ අදාල ප්‍රතිලාභියෙකු නොමැති විට එම මුදල විශ්‍රාමිකයාට ලබා ගැනීමට අවශ්‍ය විධි විධාන යොදනු ඇත.
7. අවශ්‍ය අයට සිය සන්ධ්‍යා භාගය ඉතා සුළු මුදලක් ගෙවා වෙද හෙදකම් ඇතිව විවේකයෙන් ගත කිරීම සඳහා පහසුකම් ඇති නේවාසිකාගාර ක්‍රමයක් දිස්ත්‍රික් මට්ටමින් ගොඩනගනු ඇත.
8. පාසැල්වල ඉගෙනිම ලබන දරුවන් සිටින විශ්‍රාමිකයන්ගේ වැටුපට ඒ දරුවන් ගණන අනුව අමතර දීමනාවක් එකතු කරනු ඇත.

## පොලීසිය හා ත්‍රිවිධ හමුදාව

අප ගොඩ නැගීමට බලාපොරොත්තු වන පූර්ණ වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් සඳහා අවශ්‍ය මූලික සාධකයක් නම්, සෑම පුරවැසියෙකුටම නීතිය ඉදිරියේ එක සමාන ආරක්ෂාව ලැබීමයි. මෙම අරමුණ ඉටුකර ගැනීමට යොදා ගත හැකි මූලිකතම ආයතනයක් නම්, ස්වාධීන, කාර්යක්ෂම සහ තෘප්තියට පත් පොලිස් සේවාවකි. පොලිස් සේවාව පිළිබඳ මහජන විශ්වාසය යළි ගොඩ නැඟීමටත්, මහජනතාවට යුක්තිය සහ සාධාරණත්වය අනුව සේවය කිරීමට කැප වූ සැබෑ වශයෙන්ම වෘත්තිමය වූ පොලිස් සේවයක් ඇති කරනු සඳහා, පොදුජන එක්සත් පෙරමුණ පොලිස්පති වරයාගේ ස්වාධීනත්වය තහවුරු කිරීමෙන් පොලිස් සේවය දේශපාලන බලපෑම් වලින් ආරක්ෂා කිරීමත් අරමුණු කරගත්, නීති සම්පාදනය කිරීමටත්, ආයතනික මාධ්‍යයන් බිහිකිරීමටත් කැප වෙනු ඇත. ජ්‍යෙෂ්ඨත්වය සහ කුසලතා මත පදනම් වූණු බඳවා ගැනීමේ සේවා ප්‍රතිපාදන සහ උසස්වීම් ලැබීමේ ක්‍රමයක් ඇති කිරීම මගින් පොලිසියේ සියලුම ශ්‍රේණිවල නිලධාරීන්ගේ ගරුත්වය සහ දිරිමත් බව සහතික කිරීමට ද පියවර ගන්නෙමු. මෙම ප්‍රතිසංස්කරණ පොලිස් සේවය තුළ ඇති කිරීමෙන් අප බලාපොරොත්තු වන්නේ නීතිය ඉදිරියේ සෑම පුරවැසියෙකුටම එක සමාන ආරක්ෂාව සහ නිදහස සහතික කිරීමත් එ'මගින් නීතිය හා සාමය තහවුරු කිරීමත්ය.

01. පොලිසිය හා ත්‍රිවිධ හමුදාව පටු දේශපාලන ලාභ ප්‍රයෝජන වෙනුවෙන් යොදා ගැනීමේ පහත් තත්ත්වය සහමුලින් ඉවත් කර අපක්ෂපාති ආත්ම ගෞරවයෙන් යුතු සේවාවක් බවට පොලිසිය හා ත්‍රිවිධ හමුදාව පත් කිරීමේ විශේෂ ජාතික වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනු ඇත.
02. පොලිසිය හා ත්‍රිවිධ හමුදාවේ සේවය කරන්නන් දිවා රෑ නොබලා, විවේකය, පෞද්ගලික පවුල් හා සමාජ වගකීම් නොසලකා කරන අති විශේෂ සේවාවන් වෙනුවෙන් ප්‍රමාණවත් හා ගෞරවනීය දීමනා හා පහසුකම් සැලසීමේ ක්‍රමයක් සකස් කරනු ඇත.
03. පොලිසිය හා ත්‍රිවිධ හමුදාවේ සියලු දෙනාට අවුරුදු 5 ක සේවා කාලයෙන් පසු සිය පවුල අනුව නිවාස සාදා ගැනීමට ප්‍රමාණවත් ණය මුදලක් ඉතා අඩු පොලියකට ලබා දෙනු ඇත.
04. පොලිස් උප සේවය ස්ථිර සේවයට අනුයුක්ත කරනු ලැබේ.
05. අවුරුදු 15 ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සියලු දෙනාට ඊළඟ උසස්වීම ලබා දෙනු ඇත.
06. අවුරුදු 03 ක සේවා කාලයක් අවසන් වී ඇති පොලිස් අනුබණ්ඩ විසුරුවා හැර සාමාන්‍ය පොලිස් සේවයට අනුයුක්ත කරන අතර, අළුතින් බඳවා ගන්නා අයගෙන් අනුබණ්ඩ සාදනු ලැබේ.
07. මෙහෙයුම් කලාප වල කලක් සේවය කළ අයට කැමැත්ත පරිදි මාරුවීම් පහසුකම් ලබාදෙනු ලැබේ.

## ග්‍රාමසේවා නිලධාරි

01. රාජ්‍ය පරිපාලන සේවයේ ජනතාවට ආසන්නම නිලධාරියා වන ග්‍රාමසේවා නිලධාරීන්ගේ සේවය සම්පූර්ණ අපක්ෂපාති හා දේශපාලන බලපෑම් වලින් තොර සේවාවක් බවට පත් කරනු ඇත.
02. ග්‍රාමසේවා නිලධාරි ක්‍රමයට පැවරෙන රාජකාරි කටයුතු ගෞරවනීය මට්ටමින් ආත්ම ගෞරවයකින් යුතුව කළ හැකි වන සේ අවශ්‍ය පහසුකම් හා බලතල ලබාදීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරනු ඇත.
03. මෙම සේවයේ කටයුතු කඩිනම් කිරීම සඳහාත්, පොදු ජනතාවට අප්‍රමාදව සිය සේවය ලබා දීමේ පරිසරයක් ගොඩනැංවීම සඳහාත් අවශ්‍ය නිල නිවාස, කාර්යාල හා වාහන පහසුකම් සැපයීමේ විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.

04. අධ්‍යාපන සුදුසුකම්, අවංකකම, කැපවීම, කාර්යක්ෂමභාවය හා අපක්ෂපාතී බව මත ග්‍රාමසේවා නිලධාරීන්ට රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයේ ඉහළට යැමේ ක්‍රමවත් උසස්වීම් ක්‍රමයක් සම්පාදනය කරනු ඇත.

### වෙනත් රජයේ ක්ෂේත්‍ර නිලධාරීන්

01. සමාජ සේවා නිලධාරීන්, ග්‍රාම සංවර්ධන නිලධාරීන්, ජනපද නිලධාරීන්, ප්‍රජා සංවර්ධන නිලධාරීන්, සමුපකාර පරීක්ෂකවරු හා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු, ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරීන්, කෘෂි උපදේශකවරුන් වැනි ක්ෂේත්‍ර නිලධාරීන්ගේ රාජකාරී කටයුතු ක්‍රමවත් සැලැස්මක් මත ක්‍රියාත්මක කිරීමටත්, ඔවුන්ගේ සුදුසුකම් හා සේවා තත්ත්වය මත ගෞරවාන්විත වැටුප් තලවල පිහිටුවීමටත්, ඔවුනට ක්‍රමවත් උසස්වීම් ක්‍රමයක් සම්පාදනය කිරීමටත් වාහන පහසුකම් සැපයීමටත්, විශේෂ පුහුණුවීම් සඳහා දේශීය හා විදේශීය ශිෂ්‍යත්ව ක්‍රමයක් ඇති කිරීමටත් කටයුතු සම්පාදනය කරනු ඇත.
02. දුගී බව තුරන් කිරීම සඳහා අප විසින් යෝජනා කර ඇති සමෘද්ධි සංවර්ධන වැඩ පිළිවෙළ සඳහා මෙම සියලු නිලධාරීන්ගේ සහාය ලබා ගන්නා අතර, ඔවුනට පැවරෙන වගකීම් හා රාජකාරී අනුව වැටුප් තල හා දීමනා ප්‍රතිශෝධනය කරනු ඇත.
03. සියලුම රජයේ සේවකයින්ගේ වැටුප්, උසස්වීම්., මාරුවීම් හා වෙනත් දීමනා ආදී කටයුතු නැවත පූර්ණ සමායෝජනයකට භාජනය කර ඔවුනට වඩාත් සාධාරණ හා ප්‍රතිලාභ ගෙන දෙන අයුරින් අවශ්‍ය වෙනස්වීම් කරනු ඇත.
04. උප තැපැල් ස්ථානාධිපතිවරුන් රජයේ සේවයට අනුයුක්ත කරනු ඇත.

## වෙනත් මූලික කරුණු

### 01. ආගමික කටයුතු

වසර 17 ක එක්සත් ජාතික පක්ෂ පාලනය තුළ අප රටේ ඇති වී තිබෙන සමාජ පරිහානිය සමඟ අපේ ආගම්, සාරධර්ම හා උතුම් සංස්කෘතික ගුණාංග භයානක ලෙයින් විනාශ වෙමින් පවතී. සමාජ සදාචාරයේ ද විශාල සෝදාපාළුවක් දක්නට ඇත. ජනතාව ආගමික විශ්වාසයන්ගෙන් හා සිද්ධස්ථානවලින් ඈත් වෙමින් සිටී. මේ තත්ත්වය වළකා බුද්ධාගම ඇතුළු අනෙකුත් ආගම් පිළිබඳ භක්තිය හා විශ්වාසය ගොඩනැඟීම සඳහා අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීමට අපි සෑම වෙහෙසක්ම ගන්නෙමු. මේ කාර්යය සඳහා සියළු ආගම්වල පූජ්‍ය පක්ෂයට අවශ්‍ය ගෞරවයත් හා සියළු පහසුකම් ලබා දීමට අපේ නොමඳ ආධාරය පිරිනැමෙනු ඇත.

#### සංස්කෘතිය

සංස්කෘතිය යනු සමස්ත සංවර්ධනයේ වෙන් තල නොහැකි අංගයක් බවත්, ජාතික ඒකාග්‍රතාවයේ අත්‍යාවශ්‍ය සාධකයක් මෙන්ම මාධ්‍යයක් බවත් පොදුජන එක්සත් පෙරමුණ පිළිගනී.

මේ අරමුණ ඉටු කර ගැනීම සඳහා සංස්කෘතික ප්‍රතිපත්ති සහ සැලසුම් කිරීමේ ජාතික මණ්ඩලයක් පිහිටුවනු ඇත. එහි කාර්යභාරය, අපේ සමාජයේ වෙනස් වන අවශ්‍යතාවයන්ට අනුකූල විය හැකි පරිදි නම්‍යශීලී වනු ඇත. සියලුම වාර්ගික, ආගමික හා ප්‍රාදේශීය කණ්ඩායම් මේ මණ්ඩලය තුළ නියෝජනය ලබනු ඇත. එය පාර්ලිමේන්තුවට සෘජුව ම වගකියනු ඇත.

සංස්කෘතික ප්‍රතිපත්ති තීරණය කිරීම සහ සැළසුම් කිරීමට ආධාර වන පරිදි රටේ සංස්කෘතික අවශ්‍යතා සම්පත් හා සංඛ්‍යා දත්ත ආදිය එකතු කරන තොරතුරු සහ ලේඛණ මධ්‍යස්ථානයක් පිහිටුවනු ඇත.

කලාවන්ගේ හා සාහිත්‍යයේ ස්වාධීනත්වය ආරක්ෂා කරන ගමන්ම, ජාතික කලා මණ්ඩලයේත්, සාහිත්‍ය මණ්ඩලයේත් ස්වාධීනත්වය රැකදීමට පියවර ගනු ඇත. ඒවාට කරන රජයේ මැදිහත්වීම් අහෝසි කරන අතර, රජයේ සහයෝගය සහතික කරනු ඇත.

ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩල පනත, රූපවාහිනී හා වීඩියෝ යන දෘශ්‍ය මාධ්‍යයන් ද අදාළ වන පරිදි සංශෝධනය කෙරේ. බුද්ධිමය දේපලවල අයිතිය තහවුරු වන පරිදි අවශ්‍ය සංශෝධන ඇතුළත් කරනු පිණිස බුද්ධිමය දේපොළ පනත යළි පරීක්ෂාවට ලක් කරනු ඇත.

පොදුජන එක්සත් පෙරමුණේ සංස්කෘතික ප්‍රතිපත්තියේ මූලික සංකල්ප වනු ඇත්තේ, ආරක්ෂා කිරීම, නව නිර්මාණය සහ අන්තර් සංස්කෘතික හුවමාරුවයි.

01. සියලු ජන වර්ගවල සංස්කෘතීන් හා සම්ප්‍රදායන් සුරක්ෂිත විය යුතුයි. අපට හානිදායක වූ විදේශීය සංස්කෘතික බලපෑම් වලින් අප රට ආරක්ෂා කළ යුතුය. රටක අනන්‍යතාවය ගොඩනැගෙන්නේ එහි වෙසෙන ජනතාව තුළින් බිහිවෙන සාහිත්‍යය. චිත්‍ර නිර්මාණය, ගෘහ නිර්මාණ, සංගීතය, නෘත්‍ය කලාව, සිනමාව සහ රූපවාහිනී වැනි කලාවන්ගෙන් සමන්විත සංස්කෘතිය තුලින්ය. රටක සංස්කෘතික අනන්‍යතාවය තුළින් මතුවන ශක්තිය රටක ආර්ථික හා සමාජීය සංවර්ධනය වේගවත් කරන බව අපේ මතයයි. පසුගිය 17 අවුරුද්ද තුල ආර්ථික පරිහානිය සමග එක්ව විනාශ වුනු සියලු ජන කණ්ඩායම්වල සංස්කෘතීන් අපේ නව ආර්ථික ප්‍රතිපත්තියත් සමග නගා සිටුවීමට විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරනු ඇත.

02. සිංහල, ද්‍රවිඩ භාෂාවන් හා සාහිත්‍ය දියුණු කිරීමේ ජාතික වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරනු ඇත.

03. ළමා කතා සාහිත්‍ය හා ළමා චිත්‍ර කථා සාහිත්‍ය දරුවන්ගේ රුචිකත්වය උසස් මට්ටමකට ගෙන ඒම හා ඔවුන් යහපත් පුරවැසියන් ලෙස ගොඩනැංවීමේ අරමුණින් යුතුව දියුණු කිරීමේ විශේෂ වැඩ පිළිවෙලක් සකස් කරනු ඇත.

04. හැකි තරම් ඵලදායී පොත්පත් මුද්‍රණය වැඩි කිරීම සඳහාත් නවකයින්ගේ නිර්මාණ ධෛර්‍යමත් කිරීම සඳහාත් විශේෂ ජාතික වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරනු ඇත. එසේම අධ්‍යාපනික, සාහිත්‍යමය හා සංස්කෘතික වැදගත්කමකින් යුත් ආනයනය කරන පොත් සඳහා දැනට ඇති තීරු බදු ඉවත් කරනු ඇත.

05. පාරම්පරික නැටුම්, ජනකවි, ගී, දේශීය සංගීතය නංවාලීමටත් ආරක්ෂා කිරීමටත් අවශ්‍ය සියලු කටයුතු කරනු ඇත.

06. දේශීය චිත්‍රපට හා නාට්‍ය නිෂ්පාදකයන් උනන්දු කරවීමටත් උසස් මට්ටමින් නිෂ්පාදනයන් බිහිකිරීමේ උනන්දුව වැඩිකිරීමටත් ඔවුනට අවශ්‍ය මූල්‍ය හා අනෙකුත් පහසුකම් සපයාදීමට කටයුතු කරනු ඇත.

07. ජාතික නාට්‍ය ආයතනයක් පිහිටුවමින් නාට්‍ය ක්ෂේත්‍රයේ වර්ධනයට රාජ්‍ය අනුග්‍රහය ලබා දෙනු ඇත. අංග සම්පූර්ණ නාට්‍යාගාර හා පුහුණුකිරීම් මධ්‍යස්ථාන දිස්ත්‍රික් මට්ටමින් ගොඩනැංවීමට කටයුතු කරනු ඇත.

08. 1970 - 77 අප රජය විසින් ආරම්භ කල චිත්‍රපට සංස්ථාව දේශීය චිත්‍රපට කර්මාන්තය ආරක්ෂා කර ගනිමින් වර්ධනය කර ගැනීම පිණිස නැවත නිසි පරිදි ප්‍රතිසංස්කරණය කරනු ඇත. චිත්‍රපට කර්මාන්තයට අදාල නව තාක්ෂණය, ශිල්ප ක්‍රම, නව නිර්මාණ හා දෙස් විදෙස් චිත්‍රපට පිළිබඳව තොරතුරු එක්රැස් කෙරෙන අංග සම්පූර්ණ චිත්‍රපට පුස්තකාලයක් ඇති කරනු ලැබේ. අංග සම්පූර්ණ චිත්‍රපට සංරක්ෂණාගාරයක් පිහිටුවීමට කටයුතු කරනු ඇත.

09. උසස් මට්ටමේ ළමා චිත්‍රපට හා ළමා නාට්‍ය නිර්මාණය කිරීමටත් ප්‍රදර්ශනය කිරීමටත් විශේෂ පහසුකම් යොදනු ඇත.

10. දේශීය චිත්‍රපට හා නාට්‍ය සඳහා අවශ්‍ය භාණ්ඩයන්ට විශේෂ බදු සහන ලබා දෙනු ඇත.

11. සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයක් පදනම් කරගෙන පිහිටුවනු ලබන සංස්කෘතික මධ්‍යස්ථාන තුළින් අපේ ප්‍රාදේශීය සංස්කෘතික දායාදයන් රැකගැනීමටත්. දියුණු කිරීමටත් අවශ්‍ය සියළු විධිවිධාන යොදනු ඇත.

12. කලාකරුවන් වයස්ගත වූ විට හා අබල දුබල, ඔත්පල වූ අවස්ථාවලදී ඔවුනට ගෞරවනිය ලෙස ජීවත් වීමට හැකි ලෙස රජය විසින් මාසික දීමනා ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ඇත.

13. කලාකරුවන්ගේ කටයුතු දේශපාලන බලපෑම් වලින් තොරව කරගෙන යෑමට නීතිමය රැකවරණ සළසනු ඇත.

## ජනමාධ්‍ය නිදහස

සෑම අංශයකම මාධ්‍ය වේදීන්ගේ වෘත්තීය දක්ෂතා වර්ධනය කිරීමටත්, වෘත්තීය අවස්ථා ඉටු කිරීමටත් අවශ්‍ය වන ස්වාධීන ජාතික මාධ්‍ය ආයතනයක් පිහිටුවීමට සියළු ආධාර උපකාර ලබා දෙනු ඇත.

ආණ්ඩුවේ බලය හිතුවක්කාරව පාවිච්චි කිරීම වැලැක්වීමේ ශක්තිමත් සංවරණ සහ තුලන ක්‍රමයකින් තොරව, පුද්ගලික නිදහස ආරක්ෂා කළ නොහැකිය යන්න ගැන පොදුජන එක්සත් පෙරමුණ තිර ලෙස ම විශ්වාසය තබයි. මේ සඳහා අවශ්‍ය සංවරණ සහ තුලන ක්‍රමයක් සාර්ථක වන්නේ මහජන මතය බලසම්පන්න ලෙස ප්‍රකාශයට පත් කිරීම මගින් බව ද පෙරමුණ විශ්වාස කරයි.

එබැවින්, ජනමාධ්‍ය ශක්තිමත් කිරීමටත්, නිදහස්ව සහ කිසිදු බියකින් තොරව ජනමාධ්‍යවලට ක්‍රියා කිරීමට අවශ්‍ය පරිසරය සකස් කිරීමටත් අපි අතිමහත් වැදගත්කමක් දෙන්නෙමු. අපේ මාධ්‍ය ප්‍රතිපත්තියේදී, මාධ්‍ය ආයතනවල හිමිකම, ප්‍රතිපත්ති, අදාළ නීතිරීති, මාධ්‍ය ක්ෂේත්‍රයේ පහසුකම් පිළිබඳ පරිපාලනමය ප්‍රතිපත්ති සහ ආණ්ඩුවේ ආකල්පය යන මේවා වැදගත් කොට සළකමු.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, මහජන ආරක්ෂක පණතේ, පුවත්පත් මණ්ඩල නීතියේ රාජ්‍ය රහස් පණතේ සහ පාර්ලිමේන්තු වරප්‍රසාද පණතේ ඇති, මාධ්‍ය නිදහසට බාධා පමුණුවන වගන්ති, එම නීති සංශෝධනය කිරීම මගින් ඉවත් කරන්නෙමු. මාධ්‍යවේදීන්, පාර්ලිමේන්තුවේ කමිටු ඉදිරියට කැඳවා දඬුවම කිරීම මින් මතු සිදු නොවනු ඇත.

එක්සත් ප්‍රවෘත්ති පත්‍ර (ලේක්හවුස්) සමාගමේ අයිතිය, එයට අදාළ මුල් නීතිරීතිවලට අනුව, පුළුල් කර රජයේ අයිතියෙන් ඉවත් කරනු ලැබේ. ලේක්හවුස් සමාගමේ ප්‍රාග්ධන කොටස්, කොටස් වෙළඳපොලේ විකුණනු ලබන අතර, එක තනි පුද්ගලයෙකු කණ්ඩායමක් හෝ ආයතනයක් 20%කට වඩා කොටස් ප්‍රමාණයක් අයිති කර ගැනීම වැළැක්වීම සහතික කරනු ඇත. කොටස් නිකුත් කිරීමේ මුල් අවස්ථාවේ දී, මාධ්‍යවේදීන්ට, ලේක්හවුස් ආයතනයේ සේවකයින්ට, මාධ්‍යවේදීන්ගේ සංවිධානවලට, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සඳහා ක්‍රියා කරන සංවිධාන වලට, වෘත්තිය සමිති වලට හා විද්වතුන්ගේ සංවිධානවලට ප්‍රමුඛත්වය ලැබේ.

ආණ්ඩුවේ දැන්වීම් දීම හෝ නොදීම මගින් කිසිදු පුවත් පතක් හෝ මාධ්‍ය ආයතනයක් පාලනය කිරීම හා ඒවාට බලපෑම් කිරීම හා තර්ජනය කිරීම සිදු නොවනු ඇත.

පුද්ගලික අයිතියේ තිබෙන විද්‍යුත් මාධ්‍ය වලට, ආණ්ඩුවේ පාලනයෙන් තොරව කමත්ශේම වූ ප්‍රවෘත්ති සැපයීමේ සේවයක් පවත්වා ගැනීමට ඇති නීතිමය අයිතිය, පොදුජන එක්සත් පෙරමුණ පිළිගනියි. ඒ අනුව එම අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගනු ඇත.

පුවත්පත් ආයතනවලට සහන සපයනු පිණිස, මුද්‍රණ කඩදාසි වලින් දැනට අය කරනු ලබන තීරු බද්ද පහත දැමෙන ලෙස, එම බදු ක්‍රමය සංශෝධනය කෙරේ.

මාධ්‍යවේදීන්ගේ රැකියා සුරක්ෂිතභාවය, ආරක්ෂාව, ගෞරවය, වරප්‍රසාද, විශේෂ පුහුණුවීම් සහ සාධාරණ වැටුප් ක්‍රමයක් ලබාදීමේ විශේෂ වැඩ පිළිවෙලක් සකස් කිරීමට අපි අදහස් කරමු. ප්‍රාදේශීය වාර්තාකරුවන්ගේ වැටුප් සහ දීමනා වැඩි කළ යුතු යයි ද අපි යෝජනා කරමු.

සෑම අංශයකම මාධ්‍යවේදීන්ගේ වෘත්තීය දක්ෂතා වර්ධනය කිරීමටත්, වෘත්තීය අවශ්‍යතාවයන් ඉටු කිරීමටත්, වෘත්තීය ගෞරවය ආරක්ෂා කර ගැනීමටත් අවශ්‍ය වන ස්වාධීන මාධ්‍ය ආයතනයක් පිහිටුවීමට ආධාර කිරීමට පොදුජන එක්සත් පෙරමුණ කැප වී සිටී.

## විදේශ ප්‍රතිපත්තිය

එ. ජා. ප ආණ්ඩුවේ විදේශ සම්බන්ධතා ක්ෂේත්‍රයේ ප්‍රධානම ගති ලක්ෂණය වී තිබෙන්නේ පැහැදිලි සහ සංයුක්ත ප්‍රතිපත්තියක් නොතිබීමත්, විදේශ සම්බන්ධතා සඳහා අවශ්‍ය වෘත්තීයමය නිපුණතාවය මෙන්ම ආයතනික මාධ්‍යයන් මුළුමනින්ම නොසලකා හැරීමත්ය.

පොදුජන එක්සත් පෙරමුණ විශ්වාස කරන පරිදි, ශ්‍රී ලංකාවට අවශ්‍ය මනා ලෙස සකස් වූ විදේශ ප්‍රතිපත්තියක් පදනම් විය යුතු, වෙනත් කරුණු අතර, අසල්වැසි රටවල් සමග පවත්වන යහපත් සහ මිත්‍රශීලී සම්බන්ධතා, සාර්ක් කලාපය තුළ ඇති වන එලදායි කලාපීය සහයෝගිතාව සහ වෙනස් වන ලෝක ක්‍රමයේ නව වර්ධනයක් හා ඒවායේ ප්‍රතිඵල පිළිබඳ නිවැරදි අවබෝධයක් තිබීම යන මේවා මතය. මෙහිදී වඩාත් එලදායි දකුණු-දකුණු (සංවර්ධනය වන) රටවල් අතර අන්‍යොන්‍ය සහයෝගිතාවය සඳහා වූ අවශ්‍යතාවයට අවධානය යොමුකිරීම මේ සම්බන්ධව නොබැඳි ව්‍යාපාරය ඉදිරියටත් ඉටුකරන කේන්ද්‍රිය වැඩ කොටස පිළිගැනීම, ආර්ථික වශයෙන් නැගී එන ආසියාව ලෝක මට්ටමෙන් ලබන නව වැදගත් කමට ප්‍රතිචාර දැක්වීම සහ පොදු නිරායුධකරණය හා පරමාණු නිරායුධකරණය සඳහා වූ සියළු පියවරයන්ට සහයෝගය දීම යන අංශයන් ද අතිශයින්ම වැදගත්ය.

පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩුවක් යටතේ, තානාපති ධුර ඇතුළු විදේශ සේවයේ තනතුරුවල වැඩිම ප්‍රමාණයක්, විදේශ සේවයේ නියුක්ත නිලධාරීන්ට වෙන් කරනු ඇත. විශ්‍රාමලත් දේශපාලනඥයින්, රජයේ නිලධාරීන් මෙන්ම, ඇමතිවරුන්ගේ හිතවතුන් ද, විදේශ සේවයේ තනතුරුවලට පත් නොකරනු ඇත.

## විද්‍යාත්මක ප්‍රතිපත්තිය

විද්‍යා ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා රජය කෙලින්ම සහාය දෙන අතර, විද්‍යාර්ථීන්ට හැකි සෑම සහයෝගයක්ම ද ලබා දෙනු ඇත. විද්‍යාඥයින් සහ අධිවෘත්තිකයින්ගේ කාර්යයන්හිදී හා තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී දැනට සිදුවන දේශපාලන ඇඟිලි ගැසීම් වහාම නැවැත්වීමට අපි පොරොන්දු වෙමු.

## පරිසරය

පරිසරය ආරක්ෂා කිරීම, පොදුජන එක්සත් පෙරමුණේ කාර්මික හා සංවර්ධන ප්‍රතිපත්තියේ ප්‍රධාන අංශයක් වනු ඇත. පරිසර හානියට බලපාන සියළු සාධක ඉවත්කොට, පරිසරය සුරැකීමට අවශ්‍ය පියවර නොපමාව ගනු ඇත.

## අතුරුදහන්වීම් හා මිනිමැරුම්

01. පසුගිය වකවානුව තුළ අප රටේ සිදු වූ මිනීමැරුම්, අතුරුදහන්වීම් හා අහිරහස් අපරාධ පිළිබඳව ද, දේශපාලන පළිගැනීම් පිළිබඳව ද සොයා බැලීමට විශේෂ කොමිෂමක් පත් කෙරේ.
02. මෙහි දී දේශපාලන මිනිමැරුම් හා අපරාධ මෙන් ම පාතාල ලෝකයේ මිනීමැරුම් හා අපරාධ පිළිබඳව ද සොයා බැලේ.
03. අතුරුදහන් වූ අය පිළිබඳ සත්‍ය තොරතුරු පොදු පෙරමුණ බලයට පත් වී මාස 03 ක් ඇතුළත සියලු දෙමව්පියන්ට දැනුම් දීමට කටයුතු කරනු ඇත.
04. අහිරහස් කඳවුරුවල හා සිරකඳවුරුවල කිසිදු නීතිමය පියවරක් නොගෙන රඳවා තබාගෙන සිටින අය වහා නිදහස් කෙරේ.
05. නීතිමය කටයුතු කිරීමට අවශ්‍ය දේශපාලන සිරකරුවන්ගේ එම කටයුතු කඩිනම් කෙරේ.
06. ඝාතනයට ලක් වූ, අතුරුදහන් වූ, අතවරයට ලක් වූ, අයට හා දේපලවලට පක්ෂ භේදයෙන් තොරව වහා වන්දි ලබා දේ.

REFERENCE

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

දේශපාලන බලය පිළිබඳ
ඉතාම වැදගත්
මූලධර්මයක් නම්, එය
අයිතිවාසිකමක් හෝ
ප්‍රදානයක් හෝ නොව,
හුදෙක් භාරකාරත්වයක්
පමණක්ය යන්නයි.